# මාසික මහ සභා රැස්වීම - 2022/04/08 දින

## අලව්ව ප්‍රාදේශීය සභාව

2022/04/08 වන දින පෙ.ව 09.30 ට පමණ අලව්ව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේදී පවත්වන්නට යෙදුන අලව්ව ප්‍රාදේශීය සභාවේ VI වන සැසිවාරයේ 49 වන මහ සභා රැස්වීම පිළිබඳ සංක්ෂිප්ත වාර්තාවයි.

**මෙදින සහභාගී වූ ගරු මන්ත්‍රීතුමන්ලා**

1. ගරු සභාපතිනි - පද්මා වැත්තැව මැතිනිය
2. ගරු උප සභාපති - එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.ඒ නාරද සිරිවර්ධන මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.චමින්ද සමන් කුමාර මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.ඒ.පී ෂෙල්ටන් ප්‍රේමරත්න මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඊ.එම් නිහාල් ඒකනායක මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි - ආර්.එම්.ස්වර්ණා කාන්ති රාජපක්ෂ මැතිනිය
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.පී නලින් ඩයස් රාජපක්ෂ මැතිතුමා
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.චාමින්ද ප්‍රියන්ත අතුකෝරාල මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.ඒ කරුණාරත්න මැතිතුමා
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි - එච්.ඒ.සී. නිලූ ගුණරත්න මැතිනිය
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.එච්.ගාමිණී සෙනරත් මැතිතුමා
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි - කේ.ඒ අමිතා කරුණානායක මැතිනිය
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.එම් ජයතිලක මැතිතුමා
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.ආර්.පී. කුමාර සෝමසිරි බණ්ඩාර මැතිතුමා
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි - ආර්.ඒ ශ්‍රීයානි වසන්තා රත්නායක මැතිනිය
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි - ආර්.ඒ අනෝමා දිල්රුක්ෂි රණවීර මැතිනිය
20. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා
21. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජේ.එම් අරුණ ජයලත් මැතිතුමා
22. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි - සී.ජී ශ්‍රියානි ජයලත් මැතිනිය
23. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.පී නන්දසිරි මැතිතුමා
24. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ජී අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා

**මෙදින මහ සභාවට සහභාගී නොවූ ගරු මන්ත්‍රීතුමන්ලා**

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.පී ධනුෂ්ක වීරසිංහ මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.එච්.චමින්ද වීරවංශ මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඊ.ඒ යසිත් නිරංජන් විමලවර්ධන මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.එම් ඉසුරු චතුරංග එදිරිවීර මැතිතුමා

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

අලව්ව ප්‍රාදේශීය සභාවේ VI වන සැසිවාරයේ 49 වන මහ සභා රැස්වීමට සපැමිණි අපේ සියලුම මන්ත්‍රිතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලාත්,මාධ්‍යවේදී සහෝදරයිනුත් අලව්ව ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමිය ප්‍රධාන කොටගත් එම නිළධාරීන් ඇතුළු සියලු දෙනාත් ඉතා ගෞරවයෙන් යුතුව පිළිගනු ලබනවා.

**01. <u>2022/03/08දින මහ සභා වාර්තාව ස්ථිර කිරිම.</u>**

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

2022.03.08දින මහ සභා රැස්වීම් වාර්තාව ඔබතුමන්ලා වෙත ලබාදි තිබෙනවා. එම වාර්තාව ස්ථිර කිරිමට තීරණයක් ගන්නා මෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.ඒ ශ්‍රියානි වසන්තා රත්නායක මැතිනිය**

ගරු සභාපතිතුමියනි, 2022.03.08 දින පැවති VI වන සැසිවාරයේ 48 වන මහ සභා රැස්වීම් වාර්තාව සංශෝධන වලට යටත්ව ස්ථිර කිරිම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම් නිහාල් ඒකනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

<u>මහ සභා රැස්වීම් වාර්තාවේ සංශෝධන</u>

i. සභා වාර්තාවේ 06 වන පිටුවේ අංක 02.2 ජාතික යුතුකමක් ඉටු කරමු යන නිවේදනය යටතේ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමාගේ ප්‍රකාශයට**"මෙය දිට්ඨධම්මවේදනීය කර්මයයි. මොළ හතක් තිබෙන බව පවසමින් පුද්ගලයෙකු ගෙනාවා. අන්තිමට සිදු වූයේ හතේ හතයි. අපි තව කෙනෙක්ට උසුළු විසුළු කරන විට එය අපි පසුපස එනවා."** යනුවෙන්ද ඇතුලත් විය යුතුය.

ii. සභා වාර්තාවේ 04 වන පිටුවේ අංක 02.1ලෝක කාන්තා දිනය යටතේ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. එස්.එම්. ජයතිලක මැතිතුමාගේ ප්‍රකාශයේ ඇතුලත්**"බුදුදහමත් සමඟ මුළුගැන්වී සිටින කාන්තාවන්ට ගෞරවය හිමිවුනා"** යන ප්‍රකාශය**"බුදුදහම තුලින් මුළුගැන්වී සිටි කාන්තාවන්ට ගෞරවය හිමිවුනා. මහින්දාගමනයෙන් පසු එය තවත් දීප්තිමත් වුනා."**යනුවෙන් සංශෝධනය විය යුතුය.

iii. සභා වාර්තාවේ 23 වන පිටුවේ අංක 05.13 යෝජනාවේ**ඉන්ධන 400l** ලෙස මුද්‍රණය වී ඇති අතර එය **ඉන්ධන 400L** ලෙස නිවැරදි විය යුතුය.

**02.**<u>**ගරු සභාපතිතුමිය විසින් කරනු ලබන විශේෂ නිවේදන**</u>

**02.1 -** පවතින ඉන්ධන අර්බුදය හා භාණ්ඩ හිඟය යටතේ පළාත් පාලන ආයතන ක්‍රියාකල යුතු ආකාරය පිළිබඳ උපදෙස් මාලාව පිළිබඳව ගරු මන්ත්‍රීවරුන් දැනුවත් කිරීම. ඒ අනුව ඉදිරි මාස කිහිපය තුල බාහිර ආයතන වලින් ලබා දෙන සංවර්ධන අරමුදල් ඒ සඳහා භාවිතා කල යුතු අතර සභා අරමුදල් මගින් සිදු කරන සංවර්ධන ව්‍යාපෘති තාවකාලිකව අත්හිටුවා අත්‍යාවශ්‍ය පුනරාවර්තන වියදම් පියවා ගැනීමට ක්‍රමවේද යෝජනා කල හැකි බව සඳහන් කර ඇත.

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

පවතින ඉන්ධන අර්බුදය හා භාණ්ඩ හිඟය යටතේ අපි කාර්යාලය තුල කටයුතු කල යුතු ආකාරය පිළිබඳව දැනටමත් ලේකම්තුමිය සහ කාර්ය මණ්ඩලයත් සමඟ සාකච්ඡා කර තිබෙනවා. ලිපිද්‍රව්‍ය භාවිතා කිරීමේදී එක් පිටක් භාවිතා කල කොල කාර්යාල පිටපත සඳහා භාවිතා කිරීම ආදිය මේ වන විටත් සිදුකරනවා. අපේ කාර්යාලය තුල සිදු කරන සේවාවන් අනුව නිවසේ සිට රාජකාරී කිරීමට නිලධාරීන්ට හැකියාවක් නැහැ. මීට අමතරව කමිටු වාර්තා සහ අනෙකුත් වාර්තා ඊමේල් සහ වට්ස්ඇප් මගින් යොමුකිරීම සම්බන්ධයෙන් ඔබතුමන්ලාගේ අවධානය යොමුකරනවා. එම පහසුකම් නොමැති කවුරුන් හෝ මන්ත්‍රීවරයෙක් ඇත්නම් පිටපත් ලබා දිය හැකියි.

## 03. ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ පෙත්සම් පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම.

### 03.1 නැබඩවතුර ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ රාජ්‍ය නිලධාරීන් සඳහා කාර්යාල සංකීර්ණයක් සහ රැස්වීම් ශාලාවක් ඉදිකිරීම.

ඉදිරිපත් කර ඇති ඉල්ලීම සම්බන්ධයෙන් කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් විසින් කැඳවූ 2022.01.19 දිනැති වාර්තාව අනුව අංක 1028 නැබඩවතුර ග්‍රාම නිලධාරී වසමේ නැබඩවතුර ගමෙහි මැදිලන්දගේන නමැති ඉඩමෙන් නැබඩවතුර පොලිස් ස්ථානය ඉදි කිරීම වෙනුවෙන් පර්.40 ක ඉඩම් ප්‍රමාණයක් වෙන් කිරීම සඳහා 2021.08.20 දින අංක 2021/06 දරණ මැනුම් ඉල්ලීම කුරුණෑගල ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී වෙත යොමුකර ඇති බව අලව්ව ප්‍රාදේශීය ලේකම් විසින් වාර්තා කර ඇති බව දන්වා ඇති බවත් ඒ අනුව නව පොලිස් ස්ථානය පිහිටි ඉඩම් කොටස මැනුම් කල පසු ඉතිරි කොටසින් රාජ්‍ය සේවා පියසක් ඉදි කිරීම සඳහා ප්‍රවේශ මාර්ග පහසුකම් සහිතව පර්. 20 ක ප්‍රමාණයක් ලබා දිය හැකි බවත් 2022 වසරේ නිල සෙවන ඉදි කිරීම සඳහා යෝජනා කර දත්ත පද්ධතියට ඇතුලත් කර ඇති බවත් අලව්ව ප්‍රාදේශීය ලේකම් විසින් වැඩිදුරටත් වාර්තා කර ඇති බවත් දන්වා සිටිමින් ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය විසින් යොමු කර ඇති ලිපිය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ප්‍රදේශයේ මහජන නියෝජිතයින් ලෙස එස්.එම්. ජයතිලක මැතිතුමා සහ නාරද සිරිවර්ධන මැතිතුමා ආදීන් දිගින් දිගටම කතා කිරීමේ ප්‍රතිඵලයක් ලෙස අද මෙවැනි ජයග්‍රාහී පිළිතුරක් අපිට ලැබී තිබෙනවා. මෙම මහජන නියෝජිතයින් නොසිටියා නම් අද මෙම කිසිවක් ලැබෙන්නේ නැහැ. ප්‍රාදේශීය ලේකම්තුමිය මහජන නියෝජිතයින්ගෙන් නොවිමසා කල දෙයෙහි ප්‍රතිඵලයක් ලෙසයි මෙම ගැටළුව ඇති වූයේ. සභාවක ගෞරවය සහ වගකීම අපිට රැකගෙන යාමට නොහැකි වුවහොත් හැල්ලුවට ලක් වෙන්නේ සභාවයි. එම නිසා ප්‍රදේශයේ ගරු මන්ත්‍රීවරු දෙපළ ඇතුළු සියළු මන්ත්‍රීවරුන් එකමුතුව සාකච්ඡා කිරීමෙන් ලබා ගත් ප්‍රතිඵලයඅද ලැබී තිබෙනවා. ඒ වෙනුවෙන් සියළු මන්ත්‍රීවරුන්ට ගෞරවනීය ස්තූතිය පුද කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මමත් අපේ ගරු නාරද මන්ත්‍රීතුමාත් ඒකාබද්ධ යෝජනාවක් ලෙස ගෙන ආ යෝජනාවට අනුව මෙම ඛේදවාචකය පිළිබඳව අදාල අමාත්‍යාංශ වල අවධානය යොමු කිරීමට අවස්ථාව ලැබුනා. ඒ සම්බන්ධයෙන් ඔබතුමියටත් ලේකම්තුමියටත් හිටපු සභාපතිවරුන් ඇතුළු මන්ත්‍රීවරුන්ටත් මගේ ස්තූතිය පිරිනමනවා. අද රැස්වීමක් පැවැත්වීමට ස්ථානයක් නොමැතිව, නිලධාරීන් හමුවීමට ස්ථානයක් නොමැතිව දුක් විඳිනු ලබන්නේ නැබඩවතුර බෝගමුව ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ ජනතාවයි. මේ පිළිබඳව යම් තරමක හෝ අවධානයක් යොමු වී තිබෙනවා. එය ඉටුවන තුරුම ඒ පිළිබඳව අවශ්‍ය පියවරයන් ගත යුතුයි. එම ස්ථානයේ පොලීසියක් ඉදි කිරීම ඉතාම හොඳයි. නමුත් එම පොලිස් ස්ථානයට මේ වනතුරු කිසිදු පහසුකමක් සපයා නැහැ. ඒ තුලින් සිදු වී තිබෙන්නේ එම ස්ථානයෙන් ජනතාවට සිදු වූ සේවයත් නැති වී ගොස් තිබීම මෙන්ම ස්ථාපිත කල පොලිස් ස්ථානයට වාහන පහසුකම් වැනි කිසිදු පහසුකමකුත් නොමැති වීමයි. මෙම කාරණා දෙකම යථා තත්වයට පත් කරනවා නම් එය ජනතාවට මහත් සෙතක් වෙනවා.

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මෙම ඉඩම් කොටසින් පර්. 20 ක් සේවා පියසකට වෙන් කර දීම සතුටුදායක කාරණයක්. මම වැඩ බලන සභාපතිවරයා ලෙස සිටි අවස්ථාවේදී මේ පිළිබඳව මෙම සභාවේදී කතා කලා. මහජන නියෝජිතයින් නොදැනුවත්ව රාජ්‍ය නිලධාරීගේ හිතුමතයට මෙම ස්ථානයේ තිබූ ඉඩම් ගොඩනැගිලි පොලිස් ස්ථානයක් සඳහා ලබා දීම සිදු කලා. කෙසේ වෙතත් මන්ත්‍රීතුමන්ලාගේ යෝජනා සාකච්ඡා අනුව පර්. 20 ක් ලබා ගැනීමටත් සේවා පියසක් සකස් කර ගැනීමටත් හැකියාව ලැබීම පිළිබඳව සතුටට පත් වෙනවා.

**03.2 මාබෝපිටිය ග්‍රාමයේ පිහිටා ඇති ඉපැරණි වැව ප්‍රතිසංස්කරණය කිරීම සම්බන්ධයෙනි.**

අංක 1006 හුම්බුළුව ග්‍රාම නිලධාරී වසමේ පිහිටි අක්කර 7 ½ ක් පමණ වන මාබෝපිටිය ඉපැරණි වැවෙන් කුඹුරු අක්කර 2000 කට පමණ ජලය ලබා දියහැකි බව සඳහන් කරමින් මෙම වැව ප්‍රතිසංස්කරණය කර දෙන ලෙස 2021.08.12 දිනැතිව අතිගරු ජනාධිපතිතුමා වෙත ඉල්ලීමක් කර ඇති අතර ඒ සම්බන්ධයෙන් පරීක්ෂා කර බලා අදාල වසම භාර කෘෂිකර්ම පර්යේෂණ නිලධාරීගේ නිරීක්ෂණ හා නිර්දේශ සහිත වාර්තාවක් කඩිනමින් ලබා දෙන ලෙස දන්වමින් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් අලව්ව ගොවිජන සේවා මධ්‍යස්ථානයේ ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී වෙත ඉදිරිපත් කරන ලද ලිපියේ පිටපතක් අප වෙත යොමුකර ඇත.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මෙයත් අපි ලබා ගත් ජයග්‍රහණයක්. මෙම වැව කිහිප වතාවක්ම සෑදීමට උත්සාහ කලා. නමුත් එය සිදුවුයේ නැහැ. මෙවරත් එම කටයුත්ත යට යන තත්වයකට පත්වීමටයි යන්නේ. මොකද ප්‍රාදේශීය ලේකම්තුමියගෙන් මේ පිළිබඳව අසන විට ප්‍රකාශ කලේ මෙයට පරීක්ෂණයක් පැවැත්විය යුතු බවත් එය මදක් කල් යන බවයි. මම මෙම ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයෙක් ලෙස පත් වී ආ දා පටන්ම මෙම කාරණාව සම්බන්ධයෙන් සටන් කරනවා. මෙම වැවෙහි ජලය අග්බෝව හරහා තුඹුල්ල දක්වාත් යනවා. හුම්බුළුව නැගෙනහිර, බටහිර, මල්ලැහැව, මඩවල, නැබඩවතුර දක්වාම යනවා. ගොවි සංවිධාන පහක් පමණ මෙම වැවෙහි ජලයෙන් පෝෂණය වෙනවා. මෙම වැව සංවර්ධනය වූවා නම් මේ වන විට මෙම කන්නයේ වැඩ ආරම්භ කරලා ඉවරයි. හුම්බුළුව නැගෙනහිරට සහ බටහිරට මම කොතරම් වතුර බවුසර් සංඛ්‍යාවක් පසුගිය කාලයේ අරගෙන ගියා ද යන්න ඔබතුමියත් ලේකම්තුමියත් දන්නවා.මෙම වැව සංවර්ධනය වුනා නම් එම ප්‍රශ්නයට විසඳුම් ලැබෙනවා. එම නිසා මේ පිලිබඳව වැඩි අවධානයක් යොමු කොට මැනුම් කටයුතු කිරීමට හෝ කටයුතු කරමු. මෙම වැව සකස් කිරීමට ගත් පියවර ඉදිරියටම ගෙන ගොස් වැව සංවර්ධනය කර මේ ප්‍රදේශවල ජනතාවගේ කෙත්වතු සාර කර ගැනීමට අවශ්‍ය ජලය ලබා දීමට අවශ්‍ය කටයුතු හැකි ඉක්මනින් සිදු කරමු යැයි මම ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ආර්.පී. කුමාර සෝමසිරි බණ්ඩාර මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මෙම ග්‍රාමීය වැව ඉදි කිරීම අපේ ප්‍රදේශයේ ජනතාවගේ කාලාන්තරයක සිට තිබෙන විශාල ඉල්ලීමක්. එමෙන්ම මෙම කාරණාව ප්‍රදේශය තුල අර්බුදකාරී තත්වයන් ගොඩනැගුනු කාරණාවක් වෙනවා. මෙම යෝජනාව පිළිබඳ ඉහළ තැන්වල අවධානය යොමු කර ඉදිරියටම ගොස් අවශ්‍ය නිසි පිළිතුරක් ජනතාව වෙත ලබා දීමට කටයුතු කිරීම පිළිබඳව විශේෂයෙන්ම ගරු සභාපතිතුමිය ඇතුළු මෙම මහජන මන්ත්‍රී කණ්ඩායමට මගේ ස්තූතිය පිරිනමනවා. එමෙන්ම මේ ප්‍රදේශයේ ජනතාවට උග්‍ර ජල හිඟයක් පවතිනවා. ඒ අනුව මෙම වැව ප්‍රතිසංස්කරණය කිරීම මෙන්ම පානීය ජල ව්‍යාපෘතියක් ස්ථාපිත කර ජනතාවට මහත් සෙතක් සැලසීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මෙය බොහොම සතුටුදායක කාරණයක්. ප්‍රාදේශීය ගොවිජන සේවා සංවර්ධන නිලධාරීතුමියට මෙම කටයුතු වලට සහයෝගය ලබා දෙන ලෙසට නියෝග ලැබී තිබෙනවා. එතුමිය මේ සම්බන්ධයෙන් විශාල කැපකිරීමක් කලා. මෙම වැවෙහි වැඩ ආරම්භ කල සෑම අවස්ථාවකදීම අපි රංජිත් මන්ත්‍රීතුමාටත් කතා කලා. එතුමා එම කටයුත්තේදී අපිට විශාල සහයෝගයක් සෑම මොහොතකම ලබා දුන්නා. ප්‍රදේශයේ සිටින සියළුම ජනතාව මෙම වැව ප්‍රතිසංස්කරණය කිරීමට කැමතියි. නමුත් පසුගිය කාලයේ බලයේ පැවති සෑම රජයක් විසින්ම මෙම වැව සංවර්ධනය කිරීමට කටයුතු කරන විට එයට හරස් වූයේ වීවරධාරීනුයි. අද රටෙහි පවතින තත්වය තුල පක්ෂ පාට කුල මල ජාති ආගම් භේදයෙන් තොරව ප්‍රශ්න වලට

උත්තර සොයන ජන රැල්ලක් හුම්බුළුව ගම තුලත් නිර්මාණය වුවහොත් මෙම වැව ඉදිකිරීමේ කටයුත්ත තවත් පහසු වේවි. මෙම කටයුත්තට විශාල කැපකිරීමක් කිරීම සම්බන්ධයෙන් මම රංජිත් මන්ත්‍රීතුමාට ගෞරවය පුදකරනවා. එම කටයුත්තේදී මේ සභාවේ සියළු දෙනා එතුමා සමඟ සිටින බවද ප්‍රකාශ කල යුතුයි.

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මෙය ඉතාම සතුටට කාරණයක්. මොකද මම සභාපති ධූරයේ වැඩ බලන වකවානුවේදීයි රංජිත් මන්ත්‍රීතුමා මෙම යෝජනාව ඉදිරිපත් කලේ. බලප්‍රදේශයේ අත්‍යාවශ්‍ය කටයුත්තක් සිදු වීමට යන අවස්ථාවක් ලෙස මම මෙය දකිනවා. ගරු ජනාධිපතිතුමාගේ වැව් හාරදහසක් සංවර්ධනය කිරීමේ වැඩපිළිවෙල තුල මෙම වැව සංවර්ධනය කිරීමට හැකියාව තිබෙනවා. විශාල කෙත් යායකට ජලය සපයාගත හැකි මෙම වැව ප්‍රතිසංස්කරණය කිරීම මෙන්ම ජල හිඟයෙන් පීඩා විඳින ජනතාවට පානීය ජල යෝජනා ක්‍රමයක් ලබා ගැනීමට හැකි අවස්ථාවක් ලැබීම සතුටට කරුණක්. රංජිත් මන්ත්‍රීතුමා මෙවැනි කටයුතු වලදී විශාල කැපවීම් සිදු කරන ප්‍රාදේශීය සභාවේ දක්ෂ මන්ත්‍රීවරයෙක් ලෙස හැඳින්විය හැකියි. මන්ත්‍රීවරුන්ගේ යෝජනා රැගෙන අදාල බලධාරීන්ට යැවීම තුලින් සිදු වූ ප්‍රතිඵලයක් ලෙස අද මෙය ඉදිරිපත් වී තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි,මෙය ඉතාම කාලෝචිත කටයුත්තක්. මෙම සභාවේ කිහිපවතාවක්ම මෙම වැව ප්‍රතිසංස්කරණය කිරීම පිළිබඳව කතා කර තිබෙනවා. මෙය කල යුතුම සංවර්ධන කටයුත්තක්. නමුත් කොතරම් අවශ්‍යතාවය තේරුම් කර දුන්නත් එය නිසි අවධානයට යොමු වී නැහැ. මෙම වැව කුඹුරු යායවල් තුනක් පෝෂණය කිරීමටට හැකි වැවක්. අද වර්ෂාව නැති නම් එම කුඹුරු යායවල් වැඩ කිරීමට නොහැකි තත්වයක් උදා වී තිබෙනවා. එම නිසා මෙම වැව සංවර්ධනය වීමෙන් කුඹුරු යායවල් දෙක තුනක ජනතාවට ඉතාම හොඳින් තමන්ගේ ගොවිතැන් බත් ටික කරගැනීමට හැකි වාතාවරණයක් ඇති වෙනවා. මේ පිළිබඳව අවධානය යොමු වීම සම්බන්ධයෙන් මම සතුටු වෙනවා. අපි එක් අවස්ථාවක මෙම වැව සංවර්ධනය කිරීම සඳහා විශාල උත්සාහයක් දරා මුදලුත් සොයා ගත්තා. නමුත් එය සිදු කිරීමට යන විට බාධා කරන්නන් බොහොමයක් ඉන්නවා. එය හොඳින් අවබෝධ කරගෙන කලොත් මෙම කටයුත්ත සාර්ථක කරගත හැකියි. එමෙන්ම මැනුම් කටයුතු කිරීමට ඉල්ලා තිබෙන වාර්තාව සකස් කිරීමටත් රංජිත් මැතිතුමා මැදිහත් වුනහොත් එය සාර්ථක කරගැනීමට හැකියාව ලැබේවි.අතිගරු ජනාධිපතිතුමාගේත් අවධානයට යොමු වී තිබෙන නිසා නැවත නැවතත් ගරු සභාපතිතුමිය හරහා අවධානය යොමු කරවා මෙම කටයුත්ත නියත වශයෙන්ම කල හැකියි. පක්ෂ භේදයකින් තොරව මෙම කටයුත්ත වෙනුවෙන් අපේ සහයෝගයත් නොපිරිහෙලා ලබා දෙන බව ප්‍රකාශ කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.පී නන්දසිරි මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මාබෝපිටිය වැව සංවර්ධනය කිරීම සඳහා රංජිත් මන්ත්‍රීතුමන්ලා විශාල උත්සාහයක් දරා තිබුනා. එම වැව සෑදීම ඉතාම හොඳයි. එමෙන්ම මෙම වැවෙහි නිවුන් සහෝදරයා අග්බෝව වැවයි. මාබෝපිටිය වැව මෙන්ම අග්බෝව වැවත් ඉතා විශාල වැවක්. නමුත් අග්බෝව වැව පිළිබඳව නිලධාරීන්ගේ අවධානය ගිලිහී ගොස් තිබෙනවා. මෙම වැවත් ඔය කියන කුඹුරු යායවල් සියල්ලටම ජලය ලබා ගත හැකි වැවක්. රංජිත් මන්ත්‍රීතුමන්ලාගේ ප්‍රදේශයේ වැවෙහි සංවර්ධන කටයුත්ත ඉතාමත් සාර්ථක වේවායි ප්‍රාර්ථනා කරන අතර එමෙන්ම අග්බෝව වැව පිළිබඳවත් බලධාරීන්ගේ අවධානයට යොමු වේවායි ප්‍රාර්ථනා කරනවා.

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

මේ පිළිබඳව අදහස් ප්‍රකාශ කිරීම සම්බන්ධයෙන් ඔබ තමුන්නාන්සේලාට ස්තූතිය ප්‍රකාශ කරනවා. ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරීතුමියට සහ වසම භාර කෘෂි පර්යේෂණ

නිලධාරීගේ නිරීක්ෂණ හා නිර්දේශ සහිත වාර්තාවක් ලබා දෙන ලෙස සඳහන් කර තිබෙනවා. ඒ අනුව ගොවි සංවිධානත් සමඟ සිටින තමුන්නාන්සේලා මෙම නිරීක්ෂණ හා නිර්දේශ පිළිබඳව දැඩි අවධානයෙන් සිට මෙම කටයුත්ත සාර්ථක කර ගැනීමට සහාය දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>03.3 මාර්ග නඩත්තු සැලැස්ම 2022.</u>**

මාර්ග නඩත්තු සැලැස්ම සම්බන්ධයෙන් වයඹ පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව යොමුකරන ලද ලිපියට අනුව 2022 වර්ෂය සඳහා යෝජිත මාර්ග නඩත්තු සැලැස්මට ඇතුලත් කර ඇති අලව්ව කොට්ඨාශයට අයත් මාර්ග ලේඛනයේ පිටපතක් අමුණා එවන බවත් මෙම සැලැස්මේ සඳහන් වැඩ විෂයන් මුදල් කොමිසම විසින් අනුමත කරනු ලබන ප්‍රතිපාදන මත වරින් වර මධ්‍යම රජයේ අමාත්‍යාංශ මගින් ක්‍රියාත්මක කරනු ලබන විශේෂ මාර්ග සංවර්ධන ව්‍යාපෘති මත හා හදිසි ආපදා වලදී ඇතිවන අත්‍යාවශ්‍ය නඩත්තු කටයුතු වල ප්‍රමුඛතාවය මත සංශෝධනය විය හැකි බවත් සඳහන් කර ඇති බව දන්වා සිටිමින් අලව්ව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය ලේකම් විසින් යොමු කර ඇති ලිපිය.

| මාර්ග නඩත්තු සැලැස්ම | | | | | | |
|---|---|---|---|---|---|---|
| අනු අංකය | වි.ඉ. කාර්යාලය | ක්‍රියාකාරකම | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | නඩත්තුවේ ස්වභාවය | අවසන් වරට නඩත්තු කල වර්ෂය | දල ඇස්තමේන්තු මුදල (රු.) |
| 1 | කුරුණෑගල | යාංගල්මෝදර - මොරවලපිටිය | අලව්ව | දෙපස කැලය කැපීම සහ හානි යථාවත් කිරීම | 2021 | 600,000.00 |
| 2 | කුරුණෑගල | බුජ්ජොමුව - දුම්රියපල පාර | අලව්ව | දෙපස කැලය කැපීම සහ හානි යථාවත් කිරීම | 2021 | 50,000.00 |
| 3 | කුරුණෑගල | උරුලෑමුල්ල - නවතල්වත්ත | අලව්ව | දෙපස කැලය කැපීම සහ හානි යථාවත් කිරීම | 2021 | 800,000.00 |
| 4 | කුරුණෑගල | රිටිගහදෙණිය - කඳයාය | අලව්ව | දෙපස කැලය කැපීම සහ හානි යථාවත් කිරීම | 2021 | 2,500,000.00 |
| 5 | කුරුණෑගල | මහරච්චිමුල්ල - වෙන්නොරුව | අලව්ව | දෙපස කැලය කැපීම සහ හානි යථාවත් කිරීම | 2021 | 400,000.00 |
| 6 | කුරුණෑගල | පන්නල - වදාකඩ | අලව්ව | දෙපස කැලය කැපීම සහ හානි යථාවත් කිරීම | 2021 | 400,000.00 |
| 7 | කුරුණෑගල | මහරච්චිමුල්ල - පැලවත්ත | අලව්ව | දෙපස කැලය කැපීම සහ හානි යථාවත් කිරීම | 2021 | 600,000.00 |
| 8 | කුරුණෑගල | දිවුරුම්පිටිය - මහරච්චිමුල්ල | අලව්ව | දෙපස කැලය කැපීම සහ හානි යථාවත් කිරීම | 2021 | 500,000.00 |
| 9 | කුරුණෑගල | අලව්ව - කැබැල්ලවිට | අලව්ව | දෙපස කැලය කැපීම සහ හානි යථාවත් කිරීම | 2021 | 400,000.00 |
| 10 | කුරුණෑගල | ඕතර කිරුවානාපොල - තුඹුල්ල | අලව්ව | දෙපස කැලය කැපීම සහ හානි යථාවත් කිරීම | 2021 | 200,000.00 |
| 11 | කුරුණෑගල | දම්මැහැර - දමුණුපොල | අලව්ව | දෙපස කැලය කැපීම සහ හානි යථාවත් කිරීම | 2021 | 400,000.00 |

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

මෙම මාර්ග වලට වර්ෂයක් පාසා නඩත්තු මුදලක් වෙන් වෙනවා. නමුත් ඒ පිළිබඳව අපට නිසි අවබෝධයක් නැහැ. එම නිසා මෙවැනි ලිපියක් ලබා දීම පිළිබඳව අපි ස්තූතිවන්ත විය යුතුයි. ප්‍රශ්නය නම් මේ තුලින් මාර්ග වල නඩත්තු කටයුතු සිදු කර තිබෙනවාද යන්නයි. පළාත් සභා මාර්ග වල කැලෑ වැහී ඇති බවට බොහෝ අවස්ථාවල අපිට පැමිණිලි එනවා. ජනතා අවශ්‍යතා

මත අපි එම නඩත්තු කටයුතු සිදු කරනවා. මෙසේ වෙන් කරන මුදල් වලින් සිදු වී තිබෙන්නේ මොනවාද යන්න පිළිබඳව ඉදිරියටත් අපි අවධානයෙන් සිටිය යුතුයි. මේ පිළිබඳව ඔබතුමන්ලාව දැනුවත් කල විට තම තමන්ගේ කොට්ඨාශ වල මෙම කටයුතු සිදු කෙරෙනවාදයන්න පිළිබඳව දැඩි අවධානයක් යොමු කල හැකි නිසයි මේ සම්බන්ධයෙන් ඔබතුමන්ලාව දැනුවත් කලේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.ගාමිණී සෙනරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි,රිටිගහදෙණිය කඳයාය මාර්ගයේ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස් රථයක් කොට්ටවත්ත දක්වා ධාවනය වෙනවා. පසුගිය වර්ෂාව අවස්ථාවේ රිටිගහදෙණිය පල්ලම වෙල් යාය කොටස කැඩී හැරී ගොස් තිබෙනවා. මේ පිළිබඳව පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කරන ලෙසමම සභාවට දැනුම් දුන්නා. නමුත් මේ දක්වා එය සිදු වී නැහැ. එමෙන්ම කඳයාය මාර්ගයේ දෙපැත්ත කැලේ වැවී තිබෙනවා. එම මාර්ගයේ නඩත්තුව සඳහා මුදල් වෙන් කර තිබුනත් එයත් සිදු වී නැහැ.එමෙන්ම මෙම මාර්ගය අබලන් වී සෝදාගෙන ගොස් තිබෙනවා. මීට අමතරව ප්‍රාදේශීය සභාවට අයත් මාර්ග ටිකත් කැලෑ වැඟී තිබෙනවා. එම නිසා මේවා පිළිබඳව විශේෂ අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි,දිවුරුම්පිටිය මහරච්චිමුල්ල මාර්ගයේ නඩත්තුව සඳහා මුදල් වෙන් කර තිබුනත් පාතයාල සිට දිවුරුම්පිටිය හන්දිය දක්වා නම් මාර්ගය නඩත්තු වීම ඉතාම මන්දගාමී තත්වයකයි තිබෙන්නේ. දිවුරුම්පිටිය හන්දියේ ප්‍රධාන ඇල පැත්තෙහි සම්පූර්ණයෙන් සෝදාගෙන ගොස් තිබෙනවා. ඒ සම්බන්ධයෙන් මම කිහිප වතාවක්ම අදාල ස්ථාන දැනුවත් කලත් පළාත් මාර්ග සංවර්ධන අධිකාරියෙන් මෙතෙක් කිසිවක් සිදු කලේ නෑ. මේ සම්බන්ධයෙන් අදාල ආයතන දැනුවත් කරන ලෙස ඔබතුමියගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මෙම මාර්ග වල නඩත්තුව පිළිබඳව ඉතාම කණගාටුයි. කිසිදු මාර්ගයක නිසි නඩත්තුවක් සිදු වන්නේ නෑ. වෙනත් ප්‍රදේශවල තිබෙන මාර්ග වල කම්කරු මහත්වරුන් සැමදාම මාර්ග එළිපෙහෙළි කරනු දක්නට ලැබෙනවා. මෙම මාර්ග නඩත්තුවට රජයෙන් වෙනම මුදලක් වෙන් කර තිබෙනවා. එසේ තිබියදීත් නිසි නඩත්තුවක් දක්නට නොලැබීම කණගාටුවට කරුණක්. මෙයට හේතු වී ඇත්තේ නිලධාරීනුත් සම්බන්ධ වී කොන්ත්‍රාත්කරුවන් වංචා සහගත ලෙස කටයුතු කිරීමයි. 2021 වර්ෂයේ නඩත්තු කරන ලද මාර්ග මොනවාද, නඩත්තු කිරීම ආරම්භ කලේ කවදාද, අවසන් කලේ කවදාද සහ යොදවන ලද මුදල කොපමණක්ද යන්න තොරතුරු ලබා දෙන ලෙස අපි ඉල්ලීමක් කරමු. ඒ තුලින් මෙම මුදල් ක්‍රමවේදයක් තුල වියදම් කරනවාද යන්න සොයා බැලිය හැකියි.

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

මේ සියළු මාර්ග පළාත් සභාවට අයත් මාර්ගයි. 2022 වර්ෂය සඳහා වෙන් කර තිබෙන මුදල් මාර්ග නඩත්තු කිරීම සඳහා ඒ ආකාරයට යොදවනවාද යන්න ඔබතුමන්ලාටත් අවධානය යොමු කිරීමට හැකියි. දීර්ඝ කාලීනව මෙම බල ප්‍රදේශයේ සිටි පළාත් සභා මන්ත්‍රීතුමන්ලා මෙම මාර්ගවල නඩත්තු කටයුතු සිදු කෙරුනාද නැද්ද යන්න දැනුවත් ඇති. ඒ සම්බන්ධයෙන් එතුමන්ලාගෙන් දැනගැනීමේ හැකියාව තිබෙනවා. මේ සම්බන්ධයෙන් ලබා දීමට යම් කිසි තොරතුරක් තිබෙනවා නම් ඉදිරියේදී ලබාදීමට කටයුතු කරන්නම්.

**<u>03.4 වැහි පීලි සඳහා ප්‍රතිපාදන ලබා ගැනීම.</u>**

අලව්ව රාහුල පිරිවෙන් විහාරස්ථානයෙහි නායක ස්වාමීන් වහන්සේගේ ඉල්ලීම හා අනුශාසනා පරිදි විහාරස්ථානයේ සංවර්ධන කටයුතු සඳහා අවශ්‍යා රු. 200,000.00 ක වැහිපීලි ලබා දීමට

කටයුතු සිදු කර දෙන ලෙසත් විශේෂයෙන් ප්‍රදේශයේ ඇති පිරිවෙනක් හා ආගමික වශයෙන් ද ඉතා වැදගත් විහාරස්ථානයක් ලෙසත් සලකා මෙම ඉල්ලීම ඉටු කර දෙන ලෙස ඉල්ලා සිටිමින් අලව්ව ප්‍රාදේශීය සභාවේ උප සභාපති ගරු එච්.එම්. ධර්මරත්න හේරත් මැතිතුමා විසින් යොමු කර ඇති ලිපිය.

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**
ගරු සභාපතිතුමියනි,අලව්ව රාහුල පිරිවෙන් විහාරස්ථානයෙහි නායක ස්වාමීන් වහන්සේ විසින් විහාරස්ථානයේ සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය රු. 200,000.00 ක වැඩි පීලි ලබා දීමට කටයුතු කරන ලෙස මගෙන් ඉල්ලීමක් කලා. ප්‍රදේශයට ඉතා වැදගත් ආගමික මෙහෙවරක් සිදු කරන විහාරස්ථානයක් ලෙස එම නායක ස්වාමීන් වහන්සේගේ ඉල්ලීම ඉටු කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි එච්.ජ්.සී. නිලූ ගුණරත්න මැතිනිය**
ගරු සභාපතිතුමියනි, අප ප්‍රදේශයේ තිබෙන ප්‍රධාන පන්සලක් මෙන්ම දහම් අධ්‍යාපනය දරුවන්ට ලබා දෙමින් ප්‍රදේශයේ ජනතාවට විශාල සේවයක් කරන විහාරස්ථානයක් ලෙස මෙවැනි දේ පූජා කිරීම සම්බන්ධයෙන් මම කිසිසේත් විරුද්ධ වන්නේ නෑ. නමුත් ගම සමඟ පිළිසඳරක් යෝජනා යටතේ මම මෙම විහාරස්ථානයට රු. 200,000.00 ක මුදලක් වෙන් කලා. නමුත් 1 කණුව පන්සලට මම රු. 125,000.00 ක් වෙන් කල නිසා රාහුල පිරිවෙනේ ස්වාමීන් වහන්සේ මා වෙන් කල රු. ලක්ෂ 02 ක මුදල ප්‍රතික්ෂේප කලා. මම මෙය ප්‍රකාශ කලේ මෙය සභාව දැනගත යුතු නිසයි. කිසිදු විහාරස්ථානයකට මුදලක් වෙන් කිරීම සම්බන්ධයෙන් මගේ කිසිම විරෝධතාවයක් නැහැ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, මෙම විහාරස්ථානයට මධ්‍යම රජයේ අවධානය යොමු කර ප්‍රතිපාදනය ලබා දිය යුතු විහාරස්ථානයක් වෙනවා. අපේ රජය පැවති කාලයේ ගම්පෙරලිය යටතේ රු. ලක්ෂ 10 ක මුදලක් මෙම විහාරස්ථානයට නිදහස් කලා. පළාත් සභා මන්ත්‍රී ශමල් සෙනරත් මැතිතුමාත් අවස්ථා කිහිපයකදීම මෙම විහාරස්ථානයට මුදල් ආධාර ලබා දුන්නා. මෙම ස්වාමීන් වහන්සේ ප්‍රදේශයට විශාල සේවයක් සිදුකල ස්වාමීන් වහන්සේ නමක් වෙනවා. එම නිසා උන්වහන්සේ වැඩවසන විහාරස්ථානයේ අඩුපාඩු තිබෙනවා නම් ඒවා සම්පූර්ණ කල යුතුයි. එයට අපේ විරෝධතාවයක් නැහැ.

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**
මෙම විහාරස්ථානයට විවිධ මාර්ගවලින් ප්‍රතිපාදන වෙන් වී ඇති බව පෙනී යනවා. සභාවෙන් මෙම විහාරස්ථානයට උදව් කල යුතු වුනත් අපිට සභාවේ ප්‍රතිපාදන වලින් මෙවැනි කටයුත්තකට මුදල් වෙන් කිරීමට නීතිමය ප්‍රතිපාදන නැහැ. එමෙන්ම මේ අවස්ථාවේදී අපේ මූල්‍ය හැකියාවත් ප්‍රමාණවත් නෑ. නමුත් උප සභාපතිතුමාගේ යෝජනාව හා ස්වාමීන් වහන්සේගේ ඉල්ලීම අපි ඉහළට ඉදිරිපත් කරන්නම්.

**<u>03.5 පින්නගොල්ල වත්ත ගල කැඩීමට විරෝධය දැක්වීම.</u>**
අලව්ව කිරිවානාපොල ග්‍රාමයෙහි පිහිටි පින්නගොල්ල වත්ත පිහිටි පෞද්ගලික ඉඩමෙහි පිහිටි පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත ගල් පර්වතය කඩා ඉවත් කිරීමේ සූදානමක් මේ වන විට පවතින බවට තොරතුරු ලැබී ඇති බවත් මෙම ගල් පර්වතය කඩා ඉවත් කිරීම තුලින් කැලෑ රොදෙහි ජීවත්වන වන සතුන්ට හානි සිදුවන අතර පහළ පිහිටි කුඹුරු යායවල් වලට ජල පෝෂක ප්‍රදේශයක් අහිමිවන බවත් ආසන්නයේ පවතින නිවාස වලට මෙම ගල් කොරියේ බලපෑම ඇති විය හැකි බවත් සඳහන් කරමින් මෙම ගල කැඩීමේ කටයුත්ත නවතා ගැනීමේ කටයුතු සලසා දෙන මෙන් ඉල්ලීමක් කරමින් ගමවැසියන්ගේ බලවත් විරෝධය පල කර අත්සන් ලේඛනයක් ද සහිතව කිරිවානාපොල මහරව්විමුල්ල ශ්‍රී ධර්මවර්ධනාරාමය විහාරාධිපති පූජ්‍ය උණගොල්ලේ විමල ධම්ම ස්වාමීන් වහන්සේ විසින් යොමු කර ඇති ලිපිය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජ් මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, පසුගිය කාලයේ අධිවේගී මාර්ග සංවර්ධන කටයුතු ක්‍රියාත්මක වන විට එයට අවශ්‍ය සහයෝගය අපි ලබාදුන්නා. මේවන විට මෙම බලප්‍රදේශය තුල අධිවේගී මාර්ග සංවර්ධන කටයුතු අවසන් වී තිබෙන නිසා පස් කැපීම, ගල් කැඩීම ආදියට අවසර දීමේ කිසිදු අවශ්‍යතාවයක් නෑ. මෙම සභා බල ප්‍රදේශයේ සාමාන්‍ය ජන ජීවිතයට අවශ්‍ය කරන ගල් ක්‍රෂර් කිහිපයක් පවත්වාගෙන යනවා. තවදුරටත් පිටින් පැමිණ මෙම ප්‍රදේශයේ මෙවැනි දේ කිරීම තුලින් බලප්‍රදේශයේ මහජන නියෝජිතයින් මෙන්ම සභාවටත් ජනතාවටත් ප්‍රශ්න ගණනාවකට මුහුණ දීමට සිදු වෙනවා. එමෙන්ම අද කුමන හෝ ව්‍යාපාරයක් ආරම්භ කරන විට ඒ පිළිබඳව සොයා බැලීමක් නොකරම විරෝධතා ගොනු කිරීමේ ප්‍රවණතාවයකුත් තිබෙනවා. එම නිසා මේ සම්බන්ධව අදාල සියළු දෙනා කැඳවා සාකච්ඡා කර නිවැරදි ක්‍රියාමාර්ගයකට යාම වඩාත් වැදගත් වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම් අරුණ ජයලත් මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, කිරිවානාපොල නායක ස්වාමීන් වහන්සේ මහරච්චිමුල්ල ප්‍රදේශයේ බොහෝ සමාජ සේවයක් ඉටු කරන ස්වාමීන් වහන්සේ කෙනෙක්. උන්වහන්සේ කිසිවිටෙක වැරදි ලෙස තොරතුරු ඉදිරිපත් කරන්නේ නෑ.මෙය පුරාවිද්‍යා වටිනාකමක් තිබෙන ස්ථානයක් නිසාත් ප්‍රදේශයේ ජනතාවගේ දැඩි විරෝධතාවයක් තිබෙන නිසාත් අපි සභාවක් ලෙස අපේ ඒකමතික විරෝධය මේ සඳහා පල කල යුතුයි. මෙම ස්වාමීන් වහන්සේ මෙය ඉදිරිපත් කර තිබෙන්නේ ලාභ ප්‍රයෝජන බලාපොරොත්තුවෙන් නොව සත් භාවයෙන්මයි.එම නිසා මෙම ගල කැඩීමට අපේ සභාවේ ඒකමතික විරෝධය ප්‍රකාශ කරමු යැයි මම ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි,අරුණ මන්ත්‍රීතුමා ප්‍රකාශ කල පරිදිම මෙම ස්වාමීන් වහන්සේ නිහඬව විශාල සේවයක් කරන ස්වාමීන් වහන්සේ නමක්. උන්වහන්සේට පක්ෂ භේදයක් නෑ. එම නිසා අපේ සභාවේ අවධානයට යොමු කර තිබෙන මෙම විනාශය පිළිබඳව අපි ඉතා ඕනෑකමින් අවධානය යොමු කල යුතුයි. මෙම ලිපියට අනුව පෞරාණික වැදගත්කමක් තිබෙන ස්ථානයක් බවත් සඳහන් වෙනවා. මේ පිළිබඳව අදාල කොට්ඨාශවල මන්ත්‍රීවරුන්ට තවදුරටත් සොයා බැලිය හැකියි. මෙම මහජන ඉල්ලීම පිළිබඳව සභාවේ මතය විමසා ඒ අනුව යම් තීරණයක් ගැනීමේ අවස්ථාව ඔබතුමියට තිබෙනවා. මෙමස්වාමීන් වහන්සේගේ ඉල්ලීම ඉටු කිරීමට සභාවක් ලෙස දීමට හැකි උපරිම සහයෝගය දෙමු යැයි මම ප්‍රකාශ කරනවා.

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, දඹදෙණි ඉතිහාසයේ වැදගත්ම ගලක් ලෙස හඳුන්වන වඩුවාකෙටුගල කැඩීමට ගිය අවස්ථාවේදීත් විශාල ජනතා විරෝධයක් පැන නැගී එය නැවතී ගියා. මෙම කාරණාවේදීත් එම සිද්ධියම විය හැකියි. මෙවැනි දේ තුලින් පරිසරයට හානියක් වෙනවා නම් එය සභාවට දැනුම් දීම ඉතාම හොඳ කටයුත්තක්. සභාවක් ලෙස එවැනි දෙයට ඉඩ නොතැබිය යුතුයි. එමෙන්ම ඉදිරියටත් මෙවැනි දේ නොවීමට වග බලා ගත යුතුයි. මෙහිදී සියළු දෙනා කැඳවා සාකච්ඡා කර තීරණ ගත යුතුයි.

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**
ඔබතුමන්ලාගේ අදහස් පරිදි අදාල ප්‍රදේශයේ ජනතාව සහ පරිසර නිලධාරීන් ආදීන් සමඟ සාකච්ඡා කිරීමට කටයුතු කල යුතුයි. එහිදී සභාවක් ලෙස මෙම ගල කැඩීමට විරුද්ධ මතයක අපි සිටිය යුතුයි.

**<u>03.6 රන්කෙත උයන නිවාස සංකීර්ණයට රැස්වීම් ශාලාව.</u>**
රන්කෙත උයන සුභසාධක සමිතිය සඳහා රැස්වීම් ශාලාවක් ඉදි කිරීමට වර්ෂ 2013.01.31 දින අලව්ව ප්‍රාදේශීය සභාවේ අනුමැතිය ලැබී ඇතත් රැස්වීම් ශාලාව ඉදි කිරීමට වැය විශාල මුදලක් සමිතියේ සාමාජිකයින්ට තනි

වම දැරීමට අපහසු වී ඇති නිසා සුභසාධක කටයුතු සඳහා වෙන් කල භූමියේ තාවකාලිකව ඉදි කර ගත් ගොඩනැගිල්ලක සමිතියේ සාමාජිකයින් රැස්වුවද එය ද අබලන් වී ගිය අවස්ථාවේ නැවත සකස් කිරීමට බාධාවන් පැවතුනු බවත් එම නිසා ගෘහ නිර්මාණ සැලැස්මට අනුව රැස්වීම් ශාලාවක් ඉදි කරගන්නා තෙක් සමිතියේ කටයුතු පවත්වාගෙන යාමට දැනට පවතින තාවකාලික ගොඩනැගිල්ල අළුත්වැඩියා කර ගැනීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලෙසට ඉල්ලීමක් කරමින් රන්කෙත උයන සුභසාධක සමිතියේ සභාපතිතුමා විසින් යොමු කර ඇති ලිපිය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මේ සඳහා අනුමැතිය ලබා දීම ගැටළුවක් නෑ. මෙම ගම බෙදිලයි ඉන්නේ. එම බෙදීම නැතිකරලා එක තැනකට ගෙන ඒමට හැකි නම් හොඳයි. එම නිසා ගමේ සිටින නායකයො ටික කැඳවා සියළු දෙනා එකට එකතු වී එක සමිති ශාලාවක් ඉදි කරගන්නා ලෙස ඔබතුමිය උපදෙස් ලබා දෙන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි එච්.ඒ.සී. නිලූ ගුණරත්න මැතිනිය**

ගරු සභාපතිතුමියනි, මෙම ගමෙහි පාර්ශව දෙකක් සිටිනවා. මෙම පාර්ශව දෙකටම අවශ්‍ය වී තිබෙන්නේ පොදු පහසුකම් වලට වෙන්කරන ලද ඉඩමෙහි සමිති ශාලා ඉදි කිරීමටයි. ගමක පාර්ශව දෙක තුනක් එකතු වී ගැටුමක් ඇතිවෙනවාට වඩා ඔවුන්ට එක තැනකට එන්න පුළුවන් නම් අපි මෙයට අනුමැතිය ලබා දීම යෝග්‍ය බවයි මගේ අදහස.

ඒ අනුව රන්කෙත් උයන සභා සතු භූමියේ කාර්මික නිලධාරී අධීක්ෂනය යටතේ අදාළ ගොඩනැගිල්ල අළුත්වැඩියා කරගැනීමට අනුමැතිය ලබා දිම සුදුසු බවට තීරණය විය.

<u>**03.7 අලව්ව නාරම්මල මාර්ගයේ වරිපණම් අංක 136 දරණ ස්ථානයේ පිහිටි ගොඩනැගිල්ල සම්බන්ධයෙන් කේ.ඒ. අමරතුංග යන අය විසින් ඉදිරිපත් කර ඇති ලිපිය.**</u>

මහරච්චිමුල්ල සැවැන්දන බලයලත් මිනින්දෝරු කේ.ඒ. අමරතුංග මහතා විසින් තමන්ට අයත් අලව්ව නාරම්මල මාර්ගයේ වරිපණම් අංක 136 දරණ ස්ථානයේ පිහිටි ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා අලව්ව ප්‍රාදේශීය සභාව විසින් අනුමැතිය ලබා දී ඇති බව ද එම අනුමැතියට අනුව එම ගොඩනැගිල්ලේ බිම් මහල රථ ගාලක් ලෙස අනුමත කර ඇති බවත් එහෙත් ගොඩනැගිල්ල අනුමත කර ගැනීමේදී සැලසුම් කරන ලද ව්‍යාපාරය පවතින වාතාවරණය යටතේ ඉටුකිරීම අපහසු වී ඇති බැවින් හා ප්‍රධාන මාර්ගයේ හා ප්‍රාදේශීය සභා මාර්ග සීමාවේ සිට නියමිත දුර ප්‍රමාණය තබා ගොඩනැගිල්ල ඉදි කර ඇති බැවින් රථගාලක් වශයෙන් අනුමත කර ඇති බිම් මහල ද ව්‍යාපාරික කටයුතු සඳහා භාවිතා කිරීමට අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලීමක් කරමින් යොමු කර ඇති ලිපිය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අමරතුංග මහතා මෙම ඉල්ලීම කරනු ලබන්නේ රථගාල සඳහා සාදන ලද පහත මාලයත් ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා යොදාගැනීමටයි. නමුත් ඔහු මේ වන විට පහත මහල පුරාම කාමර ඉදි කොට දොර සවිකර තිබෙනවා. ව්‍යාපාර කටයුතු වලට මේ ස්ථානය ලබා දුනහොත් එම ව්‍යාපාරිකයින්ට වාහන නැවැත්වීමට සිදුවන්නේ ප්‍රධාන මාර්ගයේයි. වාහන විශාල ප්‍රමාණයක් ගමන් කරන ස්ථානයක් නිසා මෙහි ප්‍රශ්නයක් තිබෙනවා. අපේ තාක්ෂණ නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ සවිකර තිබෙන මෙම දොර පසුපසට ගෙන රථගාල සකසා ගැනීමට හැකි තත්වයක් සකස් කර දීමට හැකි නම් එය එම ව්‍යාපාර සඳහා භාවිතා කිරීමට ලබා දීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

මෙතුමාගේ ඉල්ලීමේ ලිපියක් අපි මීට කලින් කර්මාන්ත කමිටුවට ඉදිරිපත් කලා. කමිටුවේදී ගනු ලැබූ තීරණය නම් එම ගොඩනැගිලි සැලැස්ම අනුමත කර ඇත්තේ බිම් මහල වාහන නැවතුම් සඳහා බැවින් අනුමත සැලැස්මෙන් පරිබාහිරව එය වෙනත් කාර්ය සඳහා යොදා ගැනීමට අවසර ලබා දිය නොහැකි බවයි. මාර්ග සංවර්ධන අධිකාරී මාර්ගයේ සිට අඩි 50 ක් සහ ප්‍රාදේශීය සභා මාර්ගයේ සිට අඩි 25 ක් යන සීමා අවහිර වන ලෙස යොදා ඇති පස් ඉවත් කර එම මාර්ග රක්ෂිත කොටස නිදහස් කල යුතු බවටත් අපි දැනුම් දී තිබෙනවා. ප්‍රධාන මාර්ගයට අවතීර්ණය වෙන්නේ එම ස්ථානයේයි. මෙතන අපේ සතිපොල හැදුනම විශාල වාහන තදබදයක් ඇතිවෙනවා. මොවුන්ගේ රථවාහන ගාල් කිරීමට කුමක් හෝ විකල්පයක් යොදා ගැනීමට සිදු වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මෙම මහතා හොඳ ගොඩනැගිල්ලක් ඉදි කර නාරම්මල මාර්ගයම ආලෝකමත් වන ආකාරයේ හොඳ ව්‍යාපාරයක් ආරම්භ කර තිබෙනවා. මෙම ගොඩනැගිල්ල අලව්ව නාරම්මල මාර්ගයේ මධ්‍ය ලක්ෂයේ සිට අඩි 50 ක සීමාව සහ අඹගස්වීදිය මාර්ගයේ අඩි 25 ක සීමාවත් හැර ඉදිකර තිබෙන බව එතුමා ප්‍රකාශ කර තිබෙනවා. එමෙන්ම මිදුල සකස් කිරීමේදී ඔහු අතින් යම් කිසි වරදක් සිදු වූවානම් අපේ සභාවේ කාර්මික මඩුල්ලම යොදවා ස්ථාන පරීක්ෂණයක් සිදු කර ඒ අනුව ඔහුට සාධාරණයක් ඉටු කර දෙන ලෙස එතුමා ඉල්ලීම් කර තිබෙනවා. ඒ අනුව ඉවත්කිරීමට අවශ්‍ය කොටස් ඉවත්කිරීමට එකඟ බවත් මෙම ලිපිය තුලින් ගම්‍ය වී තිබෙනවා. මෙවැනි කාලයක ව්‍යාපාරිකයෙකු බැංකු ණයක් ලබා ගෙන ගොඩනැගිල්ලක් සකස්කර ව්‍යාපාරයක් ආරම්භ කරනවා නම් එයට අපි සහයෝගය ලබා දිය යුතුයි.අලව්ව නාරම්මල මාර්ගයේ සිට පැමිණෙන වාහනයක් අඹගස්වීදිය මාර්ගයට හරවන විට එතුමා සකස් කර තිබෙන පස් කන්ද නිසා මාර්ගය පෙනෙන්නේ නැහැ. එම පස් කන්ද ඉවත් කල යුතුයි. ඒ අනුව අපේ කාර්මික නිලධාරී මහත්වරුන් තිදෙනාම එකතු වී ස්ථාන පරීක්ෂණයක් සිදු කර තිදෙනාගේම නිර්දේශය මත ඔහුට සහනයක් ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. චාමින්ද ප්‍රියන්ත අතුකෝරාල මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අලව්ව නගරයේ අපේ කියන ව්‍යාපාරිකයෙක් ඉදිරියට එනවා නම් ඒපිළිබඳව සියුම් සතුටක් සහ ආඩම්බරයක් අපිට තිබෙනවා. මෙම ස්ථානයේ ඉතා සිත්කළු ගොඩනැගිල්ලක් ඉදි වී තිබෙනවා. අපේ නගරය දියුණු වී බලප්‍රදේශය තුල කාගේ හෝ පුද්ගලයෙකුගේ ආර්ථික මට්ටම ඉහලට එනවා නම් අපි සිංහලයන් විදියට ආඩම්බර විය යුතුයි. සභාවේ යම් නීත්‍යානුකූල පසුබිමක ඔහු සම්මුතියකට පැමිණෙනවා නම් එතුමාගේ එම ඉල්ලීම ඉටු කර දීම සුදුසු බව මගේ අදහසයි. මෙම බල ප්‍රදේශයේ සිටින ව්‍යාපාරිකයින් හොඳ තැනකට ගෙන ඒමට නම් අපි සෑම දෙයකටම බාධා එල්ල නොකර ඔවුගේ අවශ්‍යතාවටය හෝ අපහසුතාවය තේරුම් ගෙන ඊට විසඳුම් ලබා දීම කල යුතුයි. ඒ අනුව මෙම කටයුත්තේදී මෙතුමාට අවශ්‍ය සහනදායී ක්‍රමෝපායන් ලබා දෙන ලෙස ඔබතුමියගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අමරතුංග මහතා යනු අපිට සේවා සපයන මිනින්දෝරු මහතෙක්. එමෙන්ම ඔහු දේශීය සිංහල බෞද්ධ පුද්ගලයෙක්. එතුමා ආරම්භ කිරීමට සූදානම් වන්නේ ඉතාමත් හොඳ ව්‍යාපාරයකුයි. ඒ සඳහා අවස්ථාව ලබා දීම අපේ යුතුකමක් වෙනවා. මෙහි ගැටළුව වන්නේ රථගාලෙහියි. කුඩා ඉඩ ප්‍රමාණයක් තිබෙන නගරයක් නිසා එතුමාට මෙම ගැටළුව ඇති වී තිබෙනවා. එම නිසා වාහන දැමීමට වෙනම ඉඩකඩක් වෙන් කිරීම අපහසු වී තිබෙනවා. ඒ අනුව මෙතුමාට මෙම ව්‍යාපාරය කරගන යාමට අවස්ථාව ලබා දිය යුතු බව මම ප්‍රකාශ කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ නාරද සිරිවර්ධන මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අමරතුංග මහතා මෙම ගොඩනැගිල්ල ඉදි කිරීමේදී තමා අතින් වැරැද්දක් සිදු වී තිබෙනවා නම් එය සකස් කර ගැනීමට කැමැත්ත ප්‍රකාශ කර තිබෙනවා. එම වැරැද්ද සකස් කර ගැනීමට අවශ්‍ය උපදෙස් ලබා දී මෙම කාර්යයට සහයෝගය ලබා දීම අපි සභාවක් ලෙස කල යුතුයි. එම නිසා අමරතුංග මහතාගේ ඉල්ලීම පිළිබඳ තාක්ෂණ නිලධාරී මහත්වරුන් මැදිහත් වී වැරැද්දක් ඇත්නම් එය නිවැරදි කර ගැනීමට සහය දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි එච්.ඒ.සී. නිලූ ගුණරත්න මැතිනිය**

ගරු සභාපතිතුමියනි, අමරතුංග මහතා මෙම ගොඩනැගිල්ල සකස් කිරීමේදී යම් කිසි අඩුපාඩුවක් සහිතව එය සිදු වී ඇත්නම් අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කර ගැනීමට සූදානම් බව ලිඛිතව ප්‍රකාශ කර තිබෙනවා. එම නිසා අපේ සභාවේ තාක්ෂණ නිලධාරී මහතුන් තිදෙනාම හෝ යොදවා අපක්ෂපාතීව නිරීක්ෂණ කටයුතුසිදු කර සුදුසු තීරණයකට එන ලෙස මම ඉල්ලා සිටිනවා. නැගී එන ව්‍යාපාරිකයෙක් ලෙස එතුමාගේ ව්‍යාපාරය එක්වරම අඩපණ කරන්නේ නැතිව අවශ්‍ය වෙනස් කිරීම් සහිතව එය දියුණු කරගෙන යාමට අලව්ව ප්‍රාදේශීය සභාවේ සහයෝගය ලබාදෙන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී නලින් ඩයස් රාජපක්ෂ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි,අලව්ව නගරයේ දියුණුව වාරියගොඩට ක්‍රම ක්‍රමයෙන් යන වකවානුවක නාරම්මල මාර්ගයෙහි හෝ මෙවැනි ව්‍යාපාරයක් ආරම්භ කිරීම අගය කල යුතුයි. අලව්ව නගරය තුල වාහනයක් නවත්වා ගැනීමට හෝ ඉඩකඩක් නැතිව තිබෙන විට මෙවැනි ව්‍යාපාරික ස්ථානයක් තුලින් අලව්ව ප්‍රදේශවාසීන්ගේ මුදල් ටික අලව්ව නගරය තුලම ගැවසීම සම්බන්ධයෙන් අගය කල යුතුයි. එම නිසා මෙවැනි ව්‍යාපාරයකට බාධා නොකර නීත්‍යානුකූලව එය සකස් කර ගැනීමට සහයෝගය ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි,මෙම සභාවේ සිටින සියළුම මන්ත්‍රීවරුන්ගේ ඒකමතික අදහස වන්නේ අමරතුංග මහතාගේ ව්‍යාපාරය දියුණු කර ගැනීමට අවස්ථාව ලබා දීම සුදුසු බවයි. අලව්ව ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමිය ඇතුළු මන්ත්‍රී මණ්ඩලය අලව්ව නගරයේ හෝ වෙනත් තැනක හෝ ව්‍යාපාරිකයෙක්ට බාධා පමුණුවා ඔහුගේ ව්‍යාපාරය කඩා කප්පල් කිරීමට කටයුතු කරන්නේ නැහැ. අවුරුදු කිහිපයක සිටම වාරියගොඩ නගරය අලව්ව නගරයට අභියෝගයක් වන බව අපි හඳුනාගෙන තිබුනා. එම නිසා අලව්ව නගරය පුළුල්වීමේදී මාර්ගය පුළුල් වී රථවාහන නවත්වා තැබිය හැකි ලෙස ඉදි කිරීමට අවධානය යොමු කල යුතුයි. එමෙන්ම නගරයක් දියුණු වීමට අතුරු මාර්ගත් වැදගගත් වෙනවා. කෙසේ වෙතත් අපේ අලව්ව නගරයේ තිබෙන භූගෝලීය පිහිටීමත් සමඟ නගරය පුළුල්වීමට ඉඩක් නැහැ. එසේ පුළුල් කිරීමට නම් අණ පණත් පැත්තකින් තබා කුඹුරු යාය ගොඩකල යුතුයි. මෙම කාරණාවේදී තාක්ෂණ නිලධාරීන් තිදෙනාම යෙදවීම වඩාත් යෝග්‍ය වෙනවා. මෙම නිරීක්ෂණය සඳහා ලේකම්තුමියත් සහභාගී වී අවශ්‍ය කටයුතු සිදු කිරීම සුදුසු බවට යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, කමිටුවේදී අපි මෙම කාරණය ඉතා දීර්ඝ වශයෙන් කතා කලා. කමිටුවේදී තීරණය වූයේ මෙම සුදුසු කටයුත්තක් නොවන බවයි. එහිදී සභාව පැත්තෙන් යම් කොන්දේසි කිහිපයක් යොමු කලා. මෙම ලිපියට අනුව එම කොන්දේසි වලට යටත්ව එතුමා කටයුතු කිරීමට කැමති බව ප්‍රකාශ කර තිබෙනවා. එම නිසා නගරයේ නැගී එන ව්‍යාපාරිකයෙක් ලෙස ඔහුගේ එම ව්‍යාපාරික කටයුතු සාර්ථක කර ගැනීමට සභාවක් ලෙස අපිට යම් සහයෝගයක් දීමට හැකි වීම ඉතාම හොඳයි.

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

අපි කිසිවිටෙකත් මෙම ව්‍යාපාරය නැවැත්වීමට තීන්දු ගත්තේ නෑ.මෙවැනි ව්‍යාපාරික ස්ථානයක් එවැනි ස්ථානයක තිබෙනවා දුටු විට මම සතුටු වුනා. මෙහි ගැටළුව නම් ප්‍රධාන මාර්ගයේ සිට අනෙක් මාර්ගයට එන විට තිබෙන අවහිරතාවයයි. ඒපිළිබඳවඅපි ඔහුව ලිඛිතව දැනුවත් කලා. ප්‍රදේශයේ ජනතාවගේ දියුණුවට දීමට හැකි උපරිම සහයෝගය අපි ලබා දෙනවා. කර්මාන්ත කමිටුවේ ගත් තීරණයට අනුව ලිඛිතව අපි එතුමාව දැනුවත් කලා මිස දැඩි නීති රීති දමා නැවැත්වීමට කටයුතු කලේ නැහැ. ඒ අනුව යථා තත්වයට පත් කරන ලෙසට එතුමාව දැනුවත් කල නිසා එතුමා මෙම ලිපිය අපිට යොමුකර තිබෙනවා. ඒ පිළිබඳව ඔබතුමන්ලාව දැනුවත් කිරීමටයි මෙම ලිපිය මහා සභාවට ඉදිරිපත් කලේ.

ඒ අනුව කාර්මික නිලධාරීන් තිදෙනා සහ ලේකම්තුමිය යොමුකර වාර්තාවක් ලබාගෙන ඉදිරි තීරණවලට එළඹීම සුදුසු බවට තීරණය විය.

**<u>03.8 සැහැල්ලු පන්දු සුහද ක්‍රිකට් තරඟාවලිය - 2022.</u>**

අප ප්‍රාදේශීය සභාව මගින් සංවිධානය කල “සැහැල්ලු පන්දු සුහද ක්‍රිකට් තරඟාවලිය - 2022” සඳහාආරාධනා කිරීම හා එම තරඟය සාර්ථකව සංවිධානය කර පැමිණි ක්‍රීඩකයන්ට හා සහභාගී වූ සැමට දිවා ආහාර හා සිසිල් පැන් ලබා දෙමින් දැක්වූ සහයෝගය සඳහා ගෞරවනීය ස්තූතිය පුද කරමින් පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව මගින් යොමු කර ඇති ලිපිය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ නාරද සිරිවර්ධන මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අප ප්‍රාදේශීය සභාව විසින් සංවිධානය කල සැහැල්ලු පන්දු සුහද ක්‍රිකට් තරඟාවලිය ඉතාම හොද කටයුත්තක්. එයට අපිටත් සහභාගී වීමට අවස්ථාව ලැබුණා. නමුත් එහිදී සිදු වූ කණගාටුදායක සිදු වීම අපේ සභාවට විශාල කැළලක්.
(සභා රීති වලට පටහැනිව අදහස් ප්‍රකාශ කරන ලදි.)

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

එම සිදුවීම සභාවට අදාල සිදුවීමක් නොවෙයි. පෞද්ගලිකව සිදුවූ ප්‍රශ්න සභාවට අදාල වෙන්නේ නෑ. කරුණාකර සභාවේ රීති වලට අනුව කටයුතු කරන ලෙසත් අසුන් ගන්නා ලෙසත් නාරද මන්ත්‍රීතුමාට දැනුම් දෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම් අරුණ ජයලත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මට වීරවංශ මන්ත්‍රීතුමත්සමඟ පෞද්ගලික ප්‍රශ්න නැහැ. සහෝදර මන්ත්‍රීවරු සියළු දෙනා මගේ දුකසැප විමසා බැළුවා. ඒ පිළිබඳව මගේ ස්තූතිය ප්‍රකාශ කරනවා. එමෙන්ම එදා සිදු වූ සිදුවීම පිළිබඳව මගේ කණගාටුව ප්‍රකාශ කරනවා.

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි,අලව්ව ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරුන් ලෙස අපිත් මෙම තරඟයට ඉදිරිපත්වුනා. අපි යෝජනා කලේ සියළුම ප්‍රාදේශීය සභාවල මන්ත්‍රීවරුන් අතර ක්‍රිකට් තරඟාවලියක් පැවැත්වීමටයි. නමුත් අනෙක් ප්‍රාදේශීය සභාවල මන්ත්‍රීවරුන් ඉදිරිපත් වූයේ නැති නිසා එය සිදු වූයේ නෑ. කෙසේ වෙතත් මේ තුලින් අනෙක් සභා සමඟ හොඳ හිත වර්ධනය වුනා. ඒ අනුව මෙම තරඟාවලිය තුලින් හොඳ ගෞරවයක් මෙම සභාවට ලැබුණා. නමුත් අවසානයේ අපේ සභාවට කැළලක් ඇති වුනා. මෙම සිද්ධියට සම්බන්ධ එම වැරදිකාර මන්ත්‍රීවයාට සුදුසු ක්‍රියාමාර්ගයක් ගත යුතුයි. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් ලෙස අපි එම සිද්ධිය හෙලා දකිනවා. එමෙන්ම මේ සම්බන්ධයෙන් දැඩි තීන්දුවක් ගන්නා ලෙස ඉල්ලා සිටිනවා. ලැබූ ගෞරවය අගෞරවයක් ලෙසට පත් කිරීම වෙනුවෙන් කණගාටු වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, සත්කාරක සභාව ලෙස අනෙක් ප්‍රාදේශීය සභා වලට ආරාධනා කර මේ සභාවේ මන්ත්‍රී මණ්ඩලය සියළු දෙනා පක්ෂ විපක්ෂ භේදයකින් තොරව මෙ තරඟ සූදානම් කලා. නමුත් සිදු වූ සිදුවීමෙන් සභාවට විශාල කළුපැල්ලමක් ඇති වුනා. මෙතෙක් කාලයකට සිටි මන්ත්‍රීවරු අතර මතවාද ඇති වුනත් එතනින් එහාට දෙයක් සිදු වුනේ නැහැ. මේ සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ගයකට යනව නම් ආණ්ඩු පක්ෂයේ 15 දෙනා එකතු වී ඒ සඳහා කටයුතු කල යුතුයි. මෙම ක්‍රීඩාගාරය සකස් කිරීමට මූලික වූයේ අරුණ ජයලත් මන්ත්‍රීතුමායි. මේ සභාව තුල යම් මන්ත්‍රීවරයෙක් දේපළකට හෝ මහජන නියෝජිතයෙකුට හානි කරනවා නම් ඔහු මේ සභාව නියෝජනය කිරීමට සුදුසු පුද්ගලයෙකු නොවෙයි. මේ පිළිබඳව ඔබතුමිය ප්‍රධාන ආණ්ඩු පක්ෂය තීන්දුවක් ගනීවි යැයි බලාපොරොත්තු වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී නලින් ඩයස් රාජපක්ෂ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි,පක්ෂ විපක්ෂ භේදයකින් තොරව අපි එදා එම ක්‍රිකට් තරඟාවලිය ඉතා හොඳින් පවත්වනු ලැබුවා. නමුත් බලාපොරෙත්තු නොවූ ආකාරයට මෙම සිද්ධිය ඇති වුනා. මෙවැනි මන්ත්‍රීවරුන් සමග එකම සභාවක කටයුතු කිරීම පවා භයානකයි. මෙවන් සර්පයන් ආණ්ඩු පක්ෂය තුල සිටිය යුතු නැහැ. මෙවැනි දේ අපි තරයේ හෙලා දකිනවා.එවැනි සිදු වීම් නැවත සිදු නොවීමට කටයුතු කරමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි,මෙම ක්‍රිකට් තරඟාවලිය සූදානම් කිරීම ඉතාම හොඳ උචිත කටයුත්තක්. එයට අපේ ගෞරවය පුද කරනවා. නමුත් එදා සිදු වූ එම සිද්ධිය ඉතාමත් කණගාටුදායක සහ අශෝබනයි. තමුන්නාන්සේලාට කණ්ඩායම් රැස්වීමේදී මේ පිළිබඳව පියවරක් ගැනීමට හැකියි. මෙවැනි දේ ඉදිරියට සිදු නොවේවායි ප්‍රාර්ථනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. චාමින්ද ප්‍රියන්ත අතුකෝරාල මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ජනතා නියෝජිතයෙක් ලෙස පත් වී පැමිණියායින් පසුව සිය දහස් සංඛ්‍යාවක් ජනතාව එම පුද්ගලයා දෙස බලා සිටිනවා. මෙවැනි සිදුවීම් අපි තරයේ හෙලා දකිනවා. නිර්ලජ්ජිත මෙම ප්‍රහාරය පිළිබඳව ඉතාම කණගාටු වෙනවා. කිසිවිටෙකත් මෙම සිදුවීම සාධාරණීකරණය නොකරන ලෙස මම ඔබතුමියගෙන් ඉල්ලා සිටිනවා. එමෙන්ම මින් ඉදිරියටවත් මෙවැනි දේ සිදු නොවීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි,මේ සභාවේ සෑම මන්ත්‍රීවරයෙක්ම මෙම ප්‍රහාරය හෙලා දකිනවා. ඒය සිදු නොවිය යුත්තක්. අපි හැඟීම් සමඟ කටයුතු කරනවාට වඩා සෙසු ප්‍රාදේශීය සභාවේ නීති රීති සම්බන්ධ කාරණා සහ ව්‍යවස්ථාවත් සමඟ කටයුතු කලයුතුයි. තමුන්නාන්සේලාගේ පක්ෂ ව්‍යාස්ථාව අනුව මේ සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගැනීම යෝග්‍යයි.

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

මෙම සිදුවීම මම අගය කලෙත් නැහැ. එමෙන්ම එයට අනුබල දුන්නෙත් නැහැ. අපි නිවසක වුවත් පිටින් පිරිසක් පැමිණ සිටින අවස්ථාවක යමක් සිදු වූ විට සියළු දෙනා අවුස්සගෙන කඩාගෙන දුවන්නට දහලන්නේ නැහැ. වැරැද්ද කරපු පුද්ගලයා වැරදියි. ඔහුට දඬුවම් දිය යුතුයි. නමුත් ඒ සඳහා ක්‍රියා මාර්ග ගත යුතු පිළිවෙලක් තිබෙනවා. මේ සම්බන්ධයෙන් ඔබතුමන්ලා එදා කටයුතු කල ආකාරය මම අනුමත කරන්නේ නෑ. මා එතන සිටියදීත් සභාපති වශයෙන් මා හට කිසිදු දැනුවත් කිරීමක් නොකර මෙම සිද්ධිය සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට යාමේදී පොලීසිය තුල හැසිරුණු ආකාරය පිළිබඳව මා කණගාටු වෙනවා. මම කිසිම කෙනෙක්ව ආරක්ෂා කිරීමට කටයුතු කලේ නෑ. මගේ දිගු දේශපාලන ගමනේ තරුණයන් පාවා දී මෙතනට

පැමිණ නැහැ. අපි සියළු දෙනාම සභාවේ ගෞරවය රැකෙන පරිදි හැසිරිය යුතුයි. මෙම සිද්ධිය සම්බන්ධයෙන් විය යුතු දේ ඉදිරියට සිදු වේවි.

**<u>03.9ආධාර මුදලක් ලබා ගැනීම සඳහායි</u>**

උඩගන්කන්ද ග්‍රාම නිලධාරී වසමේ උඩගන්කන්ද නවතල්වත්ත ලිපිනයේ පදිංචි පී.පී. ජනක නිහාල් කුමාර මහතා විසින් යොමු කර ඇති ලිපියට අනුව දෙදරු පියෙක් වන ඔහුට බගන්දරා නම් දරුණු රෝගයක් වැලදී ඇති බවත් අවුරුදු 1 ½ ක කාලයක සිට ප්‍රතිකාරලබා ගන්නා අතර සැත්කම් 12 කට ලක්ව ඇතත් තවමත් රෝගය සුව වී නොමැති බවත් තමා හට හැකි උපකාරයක් ලබා දෙන ලෙසත් ඉල්ලීමක් කර තිබෙනවා. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නන්දසිරි මැතිතුමා විසින් ද එය තහවුරු කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.පී නන්දසිරි මැතිතුමා**

ගරු සභාපතිතුමියනි,බගන්දරා නමැති දරුණු රෝගයෙන් පීඩා විඳින මෙම තැනැත්තා පාසල් යන දරුවන් දෙදෙනෙකුගේ පියෙක් වෙනවා. කිසිදු ආදායම් මාර්ගයක් නොමැතිව රෝගී තත්වයෙන් පසුවන ඔහුට යම් ආධාර මුදලක් ලබා දීම සුදුස බවට යෝජනාකරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ  මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි,එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ කරුණාරත්න මැතිතුමා**

ගරු සභාපතිතුමියනි,අපි සභාව විසින් වෙන් කරනු ලබන මෙවැනි ආධාර කඩිනමින් ලබා දීමේ ක්‍රමයක් යොදාගැනීමට හැකියාවක් තිබෙනවානම් ඒ පිළිබඳව අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි,කරුණාරත්න මන්ත්‍රීතුමා ප්‍රකාශ කල කාරණය අපි දීර්ඝ කාලයක් තිස්සේ සභාවක් ලෙස මුහුණ දෙන ගැටළුවක්. ඇතැම් අවස්ථා වල අපි තීන්දු කරන මුදල අනුමතකරන්නේ නැහැ. මෙවැනි ප්‍රශ්න වලට මුහුණ දීලම මම නම් දැන් මෙවැනි ලියුම් සභාවට ඉදිරිපත් කරන්නේ නැහැ. කොමසාරිස්තුමාගේ අනුමැතියට නොයවා අයවැයට වෙන් කරන ලද මුදල් වලින් මෙවැනි කාරණා සඳහා ලබා ගැනීමට හැකියාවක් තිනෙවාද යන්න සොයා බැලිය යුතුයි.

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

විෂය භාර අමාත්‍යවරයා ලවා අනුමත කරගත යුතු දේවල් මෙන්ම එසේ යැවීම අවශ්‍ය නොමැති දේවලුත් තිබෙනවා. ඒ සම්බන්ධයෙන් පණතේ පැහැදිලිව සඳහන් කර තිබෙනවා.

ඒ අනුව ප්‍රජා සංවර්ධන අංශයට යොමුකර ඉදිරි කටයුතු ඉටුකිරීම සුදුසු බවට තීරණය විය.

**04.** <u>යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත</u>

**05.** <u>යථා පරිදි කල් දී ඇති යෝජනා</u>

**(05-1)<u>ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය විසින් කරනු ලබන අංක 06/49 - 01 දරණ යෝජනාව</u>**

පහත නම් සඳහන් අය දෛනික පදනම මත අප සභාවේ සේවය කරන අතර ඔවුන්ගේ ගිවිසුම් කාලය 2022 ජුනි මස අවසන් වන බැවින් ඔවුන්ගේ සේවා කාලය දීර්ඝ කර ගැනීමට මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

| | නම | තනතුර | අවසන් දිනය |
|---|---|---|---|
| 1. | බී.ඒ.බී.ජී. දිසානායක | රියදුරු | 2022.06.12 |
| 2. | පී.ඒ.ජේ.එස්.එම්. ජයතිලක | රියදුරු | 2022.06.12 |
| 3. | පී.එස්.ලක්මාල් පතිරණ | රියදුරු | 2022.06.11 |
| 4. | එච්.පී.ඩී. කුලවංශ | සෞඛ්‍ය කම්කරු | 2022.06.20 |

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව ඉහත නම් සඳහන් අයගේ සේවා කාලය අවසන් වන දින සිට මාස 06 කින් දීර්ඝ කර ගැනීමට මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05-2)<u>ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක 06/49 - 02 දරණ යෝජනාව</u>**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පණතේ 78 වන වගන්තිය ප්‍රකාරව වෙනත් යම් අධිකාරියකට නීතියෙන් පවරන ලද බලතල හා වගකීම් වලට යටත්ව අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල මහජන සෞඛ්‍ය ප්‍රරෝහණය කිරීමේ සහ ආරක්ෂා කිරීමේ කාර්යයන් සඳහා 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පණතින්, පීඩා පිළිබඳ ආඥා පණතින්, නිවාස හා නගර සංවර්ධන ආඥා පණතින් සහ ඒ සඳහා තත් කාලයේ බලපවත්නා ලිඛිත නීතියකින් ඊට පවරා ඇති පොදු බලතල ඒ කාර්යය සඳහා ක්‍රියාත්මක කිරීමේ අධිකාරී බලතල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී ලහිරු සිංහ පතිරණ මහතා වෙත පැවරීම සුදුසු බව යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(05-3)<u>ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක 06/49 - 03 දරණ යෝජනාව</u>**

අලව්ව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු රැස්වීම 2022.02.03 දින සම්බන්ධීකරණ කමිටුවේ ගරු සභාපති කුරුණෑගල දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී ශාන්ත බණ්ඩාර මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලද බවත් එම රැස්වීමේදී සාකච්ඡා වූ පරිදි හුම්බුළුව නැගෙනහිර ග්‍රාම නිලධාරී වසමේ බහුකාර්ය ගොඩනැගිල්ලට ප්‍රවේශ මාර්ගය ප්‍රාදේශීය සභාවට පවරාගෙන අඩි 10 ට පළල් කර පැති බැම්මක් ඉදි කර සංවර්ධනය කරන මෙන් ඉල්ලීමක් කරමින් අලව්ව මහ ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය ලේකම්තුමිය විසින් ලිපියක් යොමු කර තිබෙනවා. ඒ පිළිබඳව තීරණයක් ගැනීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අපිට මෙම මාර්ගය අඩි 10 කට හෝ 12 කට ගැසට් කිරීමට හැකියාවක් තිබෙනවා නම් එය ඉතාමත් වටිනවා. මෙම මාර්ගයේ ආරම්භයේ අඩි 10 කට පැති බැම්මක් ඉදි කර තිබෙනවා. ප්‍රතිපාදන වෙන් කිරීම නොව කල යුත්තේ මෙය අඩි 10 කට ගැසට් කිරීමයි. අපිට නීත්‍යානුකූලව මෙම මාර්ගය ගැසට් කලහොත් යම් දවසක කාට හෝ පැති බැම්මක් ඉදි කර මාර්ගය සංවර්ධනය කිරීමේ හැකියාව ඇති වෙනවා. එම නිසා මෙම මාර්ගය අඩි 10 කට හේ 12 කට ගැසට් මාර්ගයක් ලෙස පල කිරීමට කටයුතු කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජ් මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මෙම මාර්ගය සංවර්ධනය නොවීම බොහෝ කාලයක සිට පවතින ගැටළුවක්. එය සංවර්ධනය කිරීමට ගිය විට විරෝධය ප්‍රකාශ කරන්නේ ඒක ගොවි මහතෙක් විසිනුයි. අපේ සභාවේ GIS තාක්ෂණය යටතේ මාර්ග සිතියම් කිරීමේදී එයට මෙම මාර්ගය ඇතුලත් වී නොමැති නම් ඊට ඇතුලත් කර මාර්ගය අඩි 20 ට ගැසට් කරන්න. ඉන් පසු ඒ සම්බන්ධව කිසි කෙනෙකුට ගැටළු ඇති කල නොහැකියි.

**(05-4)<u>ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක 06/49 - 04 දරණ යෝජනාව</u>**

අලව්ව ශ්‍රී රාහුල පිරිවෙනෙහි පූජ්‍ය ශ්‍රී විමලවංශ හිමියන් විසින් අලව්ව, කොහොලාන, කුරුණෑගල පාර ලිපිනයෙහි පිහිටි ඔප්පු අංක 11485 පිඹුරු අංක 3101 ඉඩම සඳහා වරිපණම් අංකයක් ලබා දෙන ලෙස ඉල්ලීමක් කර ඇත. ආදායම් පරීක්ෂකගේ වාර්තාව අනුව මෙම ඉඩම පිහිටා ඇත්තේ කුරුණෑගල පාර දකුණ අංක 148 හා අංක 160 අතරය. මෙම වරිපණම් ඒකක දෙක ඉඩම් කට්ටි 7 කට බෙදා වෙන් කර ඇති අතර එයින් 2022 වර්ෂයේ වරිපණම් ලේඛනය අනුව එක් කොටසකට ඩබ්.කේ. දිනේශ් ප්‍රනාන්දු නමින් අංක 148 දරණ අංකය තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇති අතර අදාල ඉල්ලුම්කරු වන පූජ්‍ය ජයන්තිපුර විමලවංශ හිමිගේ ඉඩම පිහිටා ඇත්තේ කුරුණෑගල පාර දකුණ අංක 148 හා 160 අතර ය. 2022 තක්සේරු ලේඛනයේ කුරුණෑගල පාර දකුණ අංක 172 ඇස්බැස්ටස් සෙවිලි හෝටලයෙහි අයිතිකරු වන ජී.ආර්. චන්ද්‍ර විමල රත්න මහතාගේ නම අංක 162 ඇස්බැස්ටස් සෙවිලි හෝටලයේ අයිතිකරු ලෙස ද අංක 160 ඇස්බැස්ටස් සෙවිලි හෝටලයේ අයිතිකරු වන ඒ. සිසිර සමරකෝන් මහතාගේ නම අංක 172 ඇස්බැස්ටස් සෙවිලි හෝටලයෙහි අයිතිකරු ලෙස ද තක්සේරු දෙපාර්තමේන්තුව වරදවා සටහන් කර ඇත. මෙහි සඳහන් අලව්ව ශ්‍රී රාහුල පිරිවෙනෙහි පූජ්‍ය ශ්‍රී විමලවංශ හිමියන්ට අයත් කුරුණෑගල පාර දකුණ පිහිටි ඉඩම සඳහා වරිපණම් අංක 148 හා අංක 160 අතර නව වරිපණම් අංකයක් ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජ් මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව අලව්ව ශ්‍රී රාහුල පිරිවෙනෙහි පූජ්‍ය ශ්‍රී විමලවංශ හිමියන්ට අයත් කුරුණෑගල පාර දකුණ පිහිටි ඉඩම සඳහා වරිපණම් අංක 148 හා අංක 160 අතර නව වරිපණම් අංකයක් ලබා දීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05-5)<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.ගාමිණී සෙනරත් මැතිතුමා විසින් කරනු ලබන අංක 06/49 - 05 දරණ යෝජනාව</u>**

අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අඩුපාඩුවක්ව පවතින ආදාහනාගාරය ඉදිකිරීම සම්බන්ධයෙන් මෙම යෝජනාව ඉදිරිපත් කරමි. මේ සඳහා අලව්ව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අංක 965 වදාව ග්‍රාම නිලධාරී වසමේ ජන වසමට අයත් වැලිහිටියාව වත්තට අයත් සරක්කුව වත්තට යාබද අලව්ව ප්‍රාදේශීය සභාවට අයත් අක්කරයක් පමණ සුසාන භූමියට අයත් ඉඩමද, එය විශාල කර ගැනීම සඳහා අවශ්‍ය වේ. එයට ඉහළින් පිහිටි ඒ. එන්. ගාමිණී අධිකාරී

මහතාගේ ඉඩමෙන් ද ලබා දීමට කැමැත්ත ප්‍රකාශ කර ඇත. ජන ශුන්‍ය කොටසක් බැවින් මෙම ස්ථානය සුදුසු වනු ඇතැයි යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.ගාමිණී සෙනරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ආදාහනාගාරයක අඩුපාඩුව අලව්ව ප්‍රාදේශීය සභාවට බෙහෙවින්ම තිබෙනවා. දිවංගත සන්ධ්‍යා සභාපතිතුමාගේ කාලයේදීත් මම මෙම යෝජනාව එතුමාට ඉදිරිපත් කලා. ආදාහනාගාරයක් ඉදි කිරීම සඳහා විශාල ප්‍රතිපාදනයක් අවශ්‍ය වෙනවා මෙන්ම ඒ සඳහා සුදුසු ස්ථානයක් නොමැති බව එතුමා ප්‍රකාශ කලා. ඉන් පසු මම මෙම ස්ථානය යෝජනා කලා. මෙම ඉඩම් කොටස මදි නම් අසල ඉඩමෙන් ලබා දීමට එම ඉඩම් හිමියා කැමැත්ත ප්‍රකාශ කලා. එම නිසා අලව්ව ප්‍රාදේශීය සභාවට අඩුපාඩුවක්ව පවතින ආදාහනාගාරයක් ඉදි කිරීමට වදාව ග්‍රාම නිලධාරී වසමේ ජන වසමට අයත් වැලිහිටියාව වත්තට අයත් සරක්කුව වත්තට යාබද අලව්ව ප්‍රාදේශීය සභාවට අයත් අක්කරයක් පමණ සුසාන භූමියට අයත් ඉඩම මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි,එය ඉතාම හොඳ යෝජනාවක්. මේ සභාවේදී අවස්ථා කීපයකදීම ආදාහනාගාරයක් ඉදිකිරීම පිළිබඳව කතාකර තිබෙනවා. නමුත් තාම එය මල්ඵල ගැන්වුනේ නෑ. අද ආදාහනාගාරයක් නැත්තේ අලව්ව සභා බල ප්‍රදේශය තුල පමණයි. මෙය දීර්ඝ කාලයක් තිස්සේ ජනතාවගේ ඉල්ලීමක්. එම නිසා මෙය කිරීමට හැකි එකම කෙනත් ඔබතුමිය බව මම විශ්වාස කරනවා. එයට සුදුසු ස්ථාන කිහිපයක් තිබෙනවා. ගොන්ගාවල සුසානභූමිය මේ සඳහා සුදුසුම ස්ථානයක්. මෙය කිරීමට හැකි වුවහොත් ඉතාම වටිනා සේවයක් වෙනවා.

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මෙම යෝජනාව දීර්ඝ කාලයක් තිස්සේ කරනු ලබන යෝජනාවක්. අලව්වට ආදාහනාගාරයක් නොමැති වීම විශාල අඩුපාඩුවක්. මේ සඳහා ස්ථාන කීපයක්ම යෝජනා වී තිබෙනවා. සෙනරත් මන්ත්‍රීතුමා යෝජනා කරන ස්ථානය අලව්ව නගරයට දුර වීම යම් ගැටළුවක්. කෙසේ වෙතත් සාකච්ඡා කර කාගේත් කැමැත්ත අනුව තීරණයක් ගත යුතුයි. පවතින තත්වය තුල මුදල් වෙන් කිරීමට ගැටළුවක් තිබෙනවා. මෙය නගරාසන්න වීම වඩාත් සුදුසුයි. එවැනි ස්ථානයක් නොමැති නම් සෙනරත් මන්ත්‍රීතුමා යෝජනා කරන ස්ථානය සුදුසුයි. ඒ අනුව ආදාහනාගාරයක් ඉදිකිරීම පිළිබඳ යෝජනාව සාර්ථක කර ගැනීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම් අරුණ ජයලත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ගාමිණී සෙනරත් මන්ත්‍රීතුමා මෙම යෝජනාව ඉදිරිපත් කලේ ඉතාම සත් භාවයෙනුයි. ආදාහනාගාරයක් ඉදිකල යුත්තේ නගරයට සහ බල ප්‍රදේශයට බොහොම පහසු මධ්‍යස්ථ ස්ථානයකයි. ඒ අනුව එතුමා යෝජනා කරන ස්ථානය පිළිබඳව ප්‍රායෝගික ප්‍රශ්නයක් තිබෙනවා. නමුත් නවක මන්ත්‍රීවරයෙක් ලෙස එතුමා ගෙන ආ යොජනාව වෙනුවෙන් ගෞරවය ප්‍රකාශ කරනවා. ඉදිරියේදී සුදුසු ස්ථානයක ආදාහනාගාරයක් ඉදිකර ගැනීමට ශක්තිය ලැබේවායි ප්‍රාර්ථනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.පී නන්දසිරි මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ගාමිණී සෙනරත් මන්ත්‍රීතුමා ඉදිරිපත් කලේ ඉතා හොඳ යෝජනාවක්. මා ද නියෝජනය කල සම්බන්ධීකරණ කමිටුවේදී අපේ ප්‍රදේශයේ පාර්ලිමේන්තු මන්ත්‍රී ශාන්ත බණ්ඩාර මැතිතුමා රු. ලක්ෂ 250 ක පමණ මුදලක් ආදාහනාගාරයක් ඉදිකිරීමට වෙන් කරන බව පැවසුවා. ඒ අනුව අපි සුදුසු ස්ථානයක් වෙන් කරගෙන එතුමාට සිහිකැඳවීමක් කලහොත් හොඳ යැයි මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ  මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි,නවක මන්ත්‍රීවරයෙක් ලෙසත් ක්‍රියාකාරී මහජන සේවකයෙක් ලෙසත් ගාමිණී සෙනරත් මන්ත්‍රීතුමා ඉතාමත් හොඳ ඍජු යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. ආදාහනාගාරයක් නොමැති වීම අප බල ප්‍රදේශයේ තිබෙන විශාල ප්‍රශ්නයක්. ආරම්භක සභාපති ගාමිණී ගුණදාස මහතාගේ කාලයේ  අලව්වට සහ නාරම්මලට ආදාහනාගාර දෙකක් ඉදිකිරීමට කටයුතු කරන ලෙස ඉල්ලීමක් ඉදිරිපත් වුනා. ඒ සඳහා රු. ලක්ෂ 25 ක පමණ මුදලක් යන නිසා එම කටයුත්ත කල් ගියා. කෙසේ වෙතත් දවටගොල්ල සුසාන භූමියේ ආදාහනාගාරය ඉදි කිරීමට කොටසක් වෙන් කර ආදාහන කටයුතු කිරීම සඳහා වෙනම ස්ථානයක් වෙන් කර තිබුනා. ඔබතුමිය සභාපති ධූරයට පත්වූ පසුව ද එය එසේම සිදු කලා. කොස් කැලේට සමීපව ආදාහනාගාරයක් ඉදි කරනවා නම් එයට සියළු දෙනා සහයෝගය දිය යුතු බවට එදා එකඟතාවයකට පැමිණියා. ආදාහනාගාරයක් ඉදි කිරීම තුලින් මහජන සේවාවක් සපයන ගමන් සභාවට මහජන සුබසාධන කටයුතු සඳහා අරමුදලකුත් එක්රැස් වෙනවා. ගරු ශාන්ත බණ්ඩාර මැතිතුමා ආදාහනාගාරයයක් ඉදි කිරීම සඳහා රු. ලක්ෂ 250 ක් ලබා දීමට කටයුතු කරනවා නම් එය වඩාත් සුදුසු ස්ථානයක ඉදිකරන ලෙසට ඉල්ලීමක් කරමු.

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

මෙය අවුරුදු ගණනාවක් තිස්සේ ඉදිරිපත් වන යෝජනාවක්. මමත් 1999 අවුරුද්දේදී මෙම යෝජනාව ඉදිරිපත් කලා. ඒ වන විට එම ඉදි කිරීම සඳහා රු. ලක්ෂ 25 ක මුදලකුයි අවශ්‍ය වුනේ. නමුත් එම යෝජනාව ක්‍රියාත්මක කිරීමට ඉඩ ලබා දුන්නේ නැහැ. එදා එය ඉදි කලා නම් අවුරුදු  දෙකක් තුල එම වියදම් කල මුදල ආපසු අපට ලබා ගැනිමට හැකියාව තිබුනා.  විටින් විට මෙම ගරු මන්ත්‍රීතුමන්ලා ආදාහනාගාරයක් ඉදි කිරීම පිළිබඳ යෝජනා ඉදිරිපත් කර තිබෙනවා. අපි කමිටුවක් සකස් කරගෙන එසේ යෝජනා වී තිබෙන ස්ථාන පිළිබඳව සාකච්ඡා කර වඩාත් යෝග්‍ය ස්ථානයක් තෝරා ගත යුතුයි. ඔබට ලබා දී තිබෙන පරිසර කමිටු වාර්තාවේ දෙවන පිටුවේ තීරණ අංක පහ - සීමාසහිත අලව්ව විවිධ සේවා සමූපාකාර සමිතිය මගින් ඉදිරිපත් කර ඇති අපද්‍රව්‍ය වැලලීම සම්බන්ධවයි යන ලිපිය මගින් සමිතිය විසින් පවත්වාගෙන යනු ලබන ගල්පොත්තේපොල පිහිටි අවමංගල්‍ය සේවා ස්ථානයෙන් ඉවත් කරන අපද්‍රව්‍ය පරිසරයට හානි නොවන පිරිදි අලව්ව සුසාන භූමියේ වැලලීමට අවශය කටයුතු ඉටුකර දීමට කටයුතු කරන මෙන් ඉල්ලීමක් කර තිබුනා. අපි එදා කමිටුවේදී සාකච්ඡා කර තීන්දු කලේ සමූපාකාර සමිතිය වැනි තැනකට අපේ සහයෝගය ලබා දිය යුතු නිසා අපි ඔවුන්ට මෙම කටයුත්ත සඳහා එක් තැනක් වෙන්කර දීමටයි. ගාමිනී ගුණදාස මැතිතුමා සභාපති ධූරය දරණ සමයේ එම්බාම් කටයුතු කිරීම සඳහා සුසාන භූමිය තුල ගොඩනැගිල්ලක් සාදා තිබුනා. නමුත් ජනතාව එයට කැමති වුනේ නැහැ. අපිට එම ගොඩනැගිල්ලම ප්‍රතිසංස්කරණය කර සමූපාකාර සමිතියට ලබා ගන්නා ලෙසත් යෝජනා කල හැකියි. කෙසේ වෙතත් යම් සීමාවක් ඒ සඳහා වෙන් කරදීම වඩාත් යෝග්‍යයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ  මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අලව්ව නගරය ඔස්සේ ගලා බසිනම්දෙල්ලමුල්ල අතු ගංගාවට තමයි මල්ශාලාවලින් ගොඩක් අපද්‍රව්‍ය දාන්න ගත්තේ. කුඹුරු හිමියන්ගෙන්, ගොවි සංවිධාන වලින් ආපු දැඩි විරෝධතාවය නිසා එවකට සභාපතිවරයාව කටයුතු කල ගාමිණී ගුණදාස මැතිතුමා අලව්ව සුසාන භූමියේ කොටසක මෙම ගොඩනැගිල්ල ඉදි කලා. නමුත් එය ක්‍රියාත්මක වුනේ කෙටි කාලයකට පමණයි. කෙසේ වෙතත් අලව්ව විවිධ සේවා සමූපාකාර සමිතිය සතු මල් ශාලාවේ කටයුතුවලදී ඉවත් කරන අපද්‍රව්‍ය අලව්ව සුසාන භූමියේ සභාව විසින් හඳුනාගත් ස්ථානයක යටපත් කිරීම සඳහා සභාවේ අවසරය ලබා දිය යුතු බවට යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.ගාමිණී සෙනරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

## (05-6)ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.ගාමිණී සෙනරත් මැතිතුමා විසින් කරනු ලබන අංක 06/49 - 06 දරණ යෝජනාව

පහත සඳහන් කමිටු සඳහා වැත්තැව කොට්ඨාශය නියෝජනය කරන මන්ත්‍රීවරයා වශයෙන් මා හට සම්බන්ධ වීමට අවස්ථාව සලසා දෙන මෙන් ඉල්ලා සිටිමි.

i. පරිසර හා පොදු පහසුකම් කාරක සභාව
ii. කාර්මික සේවා කාරක සභාව.
iii. සංවර්ධන උපදේශන කාරක සභාව
iv. ප්‍රසම්පාදන කාරක සභාව
v. මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව
vi. පරිසර උපදේශන කාරක සභාව

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව ඉහත සඳහන් කමිටු සඳහා වැත්තැව කොට්ඨාශය නියෝජනය කරන මන්ත්‍රීවරයා වශයෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.ගාමිණී සෙනරත් මැතිතුමා හට සම්බන්ධ වීමට අවස්ථාව සලසා දීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

## (05-7)ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය විසින් කරනු ලබන අංක 06/49 - 07 දරණ යෝජනාව

බෝයවලාන සතිපොලෙහි කඩකාමර ලබා දීමේදී මතුවූ ගැටළුවක් සම්බන්ධයෙන් නිලධාරීන් සමඟ මා එම ස්ථානය පරීක්ෂා කරන ලද අතර එහිදී දක්නට ලැබුනු ගැටළු සම්බන්ධයෙන් 2022.03.24 දින මාගේ ප්‍රධානත්වයෙන් බෝයවලාන සතිපොලෙහි දැනට වාර්ෂික බදු ගිවිසුම් යටතේ බදු ලබා දී ඇති වෙළඳ මහතුන් සිව්දෙනා හා බෝයවලාන පොදු වෙළඳ සංකීර්ණයේ කඩ කාමර බදු හිමියන් අතර විශේෂ සාකච්ඡාවක් පැවැත්වුනු අතර මේ වන විට එම ස්ථාන දෙකෙහිම වර්තමාන තත්වය හා සාකච්ඡා කල කරුණු සම්බන්ධ වාර්තාවක් ඔබතුමන්ලා වෙත ඉදිරිපත් කර ඇත. ඒ අනුව එදින ගත් යෝජනා අවශ්‍ය සංශෝධන සහිතව ක්‍රියාත්මක කිරීම සඳහා ගරු මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

### 01.බෝයවලාන සතිපොල

| අ.අ | වර්තමාන තත්වය | සාකච්ඡාවේ දී ගත් යෝජනා |
|---|---|---|
| 01. | බෝයවලාන සතිපොලෙහි වර්ග අඩි 68.7 ක බිම් කොටසක් රුපියල් 1000.00 මාසික ගාස්තුවකට වෙළඳ මහතුන් සිව් දෙනෙකුට ලබා දී ඇත.   | 01. බෝයවලාන සතිපොලෙහි වර්ග අඩි 34.35 ක බිම් කොටසක් රුපියල් 1000.00 මාසික ගාස්තුවකට ලබා දිම සුදුසු බව.(දැනට දි ඇති බිම් කොටසින් ½ ) <br> 02. එම කොටස් ආවරණය කිරිමෙන් වැලකි විවෘතව තැබිය යුතු බව <br> 03. තමාට හිමි පොල ගොඩනැගිල්ලෙහි පිටු පසින් තමන්ට හිමි අතිරික්ත භාණ්ඩ ගබඩා කිරිමට තාවකාලික ආවරණයක් සහිතව වර්ග අඩි 34.35 ක ප්‍රමාණයක් රුපියල් 400.00 මාසික ගාස්තුවකට ලබා දිම.   |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | | මාසික ගාස්තුව 400.00 |

## 02.බෝයවලාන පොදු වෙළඳ සංකීර්ණය

| අ.අ | වර්තමාන තත්වය | සාකච්ඡාවේ දී ගත් යෝජනා |
|---|---|---|
| 01. | බෝයවලාන වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 12ක් මේ වන විට වසා ඇත.නමුත් අදාල බදුකරුවන් නියමිත ගාස්තුගෙවා ඇත.<br><br>02.කඩ කාමර 2 ක දොරවල් දිරාපත් වී භාවිතා කිරීමට නොහැකි තත්වයේ ඇත.<br><br>03.වෙළඳ සංකීර්ණය අළුත් වැඩියා කළ යුතු මට්ටමේ ඇත. | 01.මේ වන විට වසා ඇති කඩ කාමර නැවත විවෘත කිරීමට උපදෙස් ලබා දුන් අතර,එසේ කටයුතු නොකරන සියළුම කඩ කාමර සභාවට පවරා ගෙන නැවත ටෙන්ඩර් කර බදු ලබා දීම.<br><br>02.සියළුම කඩ කාමරවලට අදාළව නව බදු ගිවිසුමක් නැවත අත්සන් කිරීම.<br><br>03.වෙළඳ සංකීර්ණය අළුත් වැඩියා කිරීම යෝග්‍ය බව |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මේ පිළිබඳව මනා අවබෝධයක් ලබාගෙන සභාවට ඉදිරිපත් කිරීම සම්බන්ධව ඔබතුමියට ගෞරවය පුද කරනවා. මෙම ගොඩනැගිල්ල අවලස්සන වී තිබෙන්නේ මෙම වසා තබා තිබෙන කඩකාමර නිසයි. නමුත් මෙම කඩකාමර වෙනත් කෙනෙකුට ලබා දීමට නොහැකි වී තිබෙන්නේ මොවුන් සෑම අවුරුද්දකම නියමිත බදු මුදල සභාවට ගෙවන නිසයි. ඇතැමුන් සභාවට ගෙවන මුදලට වඩා වැඩි මුදලක් වෙනත් ව්‍යාපාර වලට කඩකාමරය ලබා දීමෙන් උපයනවා. පොළ දවසටත් සහභාගී වන්නේ වෙළෙන්දන් කිහිපදෙනෙක් පමණයි. කෙසේ වෙතත් මෙය ඉතා වටිනා සභාවට ආදායමක් උපයා ගැනීමට හැකි ස්ථානයක්. සම්පත් තිබියදී අපි ඒවා පිළිබඳව අවධානය යොමු නොකිරීම තුල මේ තත්වය උදා වී තිබෙනවා. මෙම ගොඩනැගිල්ල කඩා දෙමහල් ගොඩනැගිල්ලක් ඉදි කිරීමට දිවංගත සන්ධ්‍යා කුමාර සභාපතිතුමා යෝජනාවක් ගෙනවිත් දේශීය ණය අරමුදලින් ණයක් පවා අනුමත කර ගැනීමට උත්සාහ කලා. නමුත් කාලයත් සමඟ එය යටපත් වුනා. නාරද මන්ත්‍රීතුමත්, මමත් මේ පිළිබඳව මැතිවරණ කාලයේදී මැතිවරණ ප්‍රකාශයටත් යොමු කර තිබුනා. අපේ රජය කාලයේ පාඨලී චම්පික මැතිතුමාගේ අවධානයට මෙය යොමු කල නමුත් අපිට ඒ අවස්ථාවේදී කාලය මදි වුනා. මෙය ප්‍රදේශයට ඉතාම අත්‍යාවශ්‍ය සේවයක් සැපයීමට හැකි ස්ථානයක්. ගම්මාන 10 ක් 12 ක් ආවරණය වන නගරයක්. මේ පිළිබඳව දැන් හෝ අවධානය යොමු කිරීම පිළිබඳව සතුටු වෙනවා. ප්‍රදේශයේ ජනතාවට විශාල සේවයක් මෙන්ම සභාවේ ආදායම් තත්වය වර්ධනය කර ගැනීමටත් මෙය හේතුවක් වෙනවා. ඒ සඳහා සහයෝගය ලබා දීමට අපි සූදානමින් සිටිනවා. දැනට ලබා ගෙන තිබෙන කඩකාමර විවෘත කරන්නේ නැතිනම් ඒවා සභාවට අරගෙන ස්වයං රැකියා හෝ ව්‍යාපාර කරන පුද්ගලයන්ට සභාවට ආදායමක් ලැබෙන ආකාරයට ලබා දීම ඉතාම වැදගත්. එමෙන්ම සභාට අයත් ස්ථාන දෙකක් මේ වන විට අහිමි වී තිබෙනවා. ඒ පිළිබඳවත් අවධානය යොමු කර තීරණයක් ලබා ගත යුතුයි. පසුගිය කාලයේ අනුමත වූ වෙළඳ සංකීර්ණ ගොඩනැගිල්ලම නැවත ඉදි කිරීමට හැකි නම් ඒ පිළිබඳවත් අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අපේ සභාවට අයත් දේපළක් ආරක්ෂා කර ගනිමින් ක්‍රමවත්ව සහ විධිමත්ව මේ ගෙනයන වැඩපිළිවෙල පිළිබඳව අපේ ගෞරවනීය ස්තූතිය පුද කරනවා. අපි මීට කලින් බෝයවලාන නගරයේ වෙළඳ සංකීර්ණයක් සෑදීමට යෝජනා ඉදිරිපත් කර ණයඅනුමත කර ගැනීමට උත්සාහ කලනමුත් සභාවේ ආදායමත් සමඟ එම ණය ලබා ගැනීමේ කටයුත්ත සිදුකිරීමට නොහැකි වුනා. කෙසේ වෙතත් මේ අවස්ථාවේදී එම වෙළඳ සංකීර්ණයට අංග සම්පූර්ණ ලස්සන වෙළඳ සංකීර්ණයක් ඉදිකිරීමට අවස්ථාව තිබෙනවා නම් ඉතාම වටිනවා. එමෙන්ම පොළ භූමියට ඇතුල්වන තැන කාණුව විවෘතවයි තිබෙන්නේ. එම කාණු පද්ධතියට කොන්ක්‍රීට් කැට ටිකක් දමා ගමනාගමනයට සුදුසු ආකාරයට සකස් කිරීම යෝග්‍ය බවට මම යෝජනා කරනවා. පොළ භූමිය දැන් ඉතා පිරිසිදුව තිබෙනවා. සභාව සතු දේපළ යම් ක්‍රමවේදයක් යටතේ අන් අය සතු වී තිබෙනවා නම් ඒවා ලබාදීමටත් ක්‍රමවේදයක් යෙදිය යුතුයි. එමෙන්ම සතිපොල දිනය සඳුදාට යෙදීම නිසා වෙළඳ මහතුන් මෙන්ම පාරිභෝගිකයිනුත්අඩුවන නිසා වෙළඳ සංගමය සාකච්ඡා කර ඉරිදා වැනි දිනයක් යොදා ගන්නේ නම් වඩාත් යෝග්‍ය වෙනවා. එමෙන්ම අවට සතිපොල වල වෙළඳ සංගම් සමඟත් සාකච්ඡා කර වෙළඳ මහතුන් පිරිසක් ගෙන්වා ගැනීමට හැකි නම් එයින් සභාවේ ආදායමත් වැඩි වෙනවා. ඔබතුමියගේ මෙම වැඩපිළිවෙල පිළිබඳව ගෞරවය පුදකර සිටින අතර ඒ සඳහා අපි සියළු දෙනාගේ සහයෝගය ලබා දෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජ් මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අලව්ව බස් නැවතුම්පොලේ කඩ කාමර පිළිබඳවත් අපි දරන්නේ එකම ස්ථාවරයමයි. සභාවේ රීති මාලාවට යටත්ව සභාව විසින් මෙය පාලනය කල යුතුයි. එයට දේශපාලන අධිකාරිය ලෙස අපි මැදිහත් වී ඒ තුලවෙනත් කටයුතු කිරීමට ගියහොත් සභාවට අවශ්‍ය කරන ආදායම් මාර්ගය ලැබෙන්නේ නැහැ. සභාව පිළිබඳව ජනතාවගේ තිබෙන විශ්වාසයත් පළුදු වෙනවා. බෝයවලාන සතිපොල සම්බන්ධව ගැටළු ගණනාවක් පසුගිය කාලයේ පැවතියා. ඒ අනුව මෙම බෝයවලාන සතිපොල භූමිය පිළිබඳ ප්‍රශ්නය මැනවින් තේරුම් ගෙන ඔබතුමිය නිවැරදි ආකාරයෙන් කටයුතු කිරීම සම්බන්ධයෙන් විපක්ෂයක් ලෙස අපේ ගෞරවය පුද කරනවා.

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

මම මෙහිදී ව්‍යාපාරිකයින් කිසිම කෙනෙකුගේ දේශපාලන පසුබිම කුමක්ද යන්න සොයා බැළුවේ නැහැ. පළමුවෙන්ම මෙය පිරිසිදු කර නිවැරදි කරගත යුතුයි. මෙම යෝජනාවට ඉදිරියේදී තමුන්නාන්සේලාගේ අදහස් ද බලාපොරොත්තු වෙනවා.

ඒ අනුව ඉහත සඳහන් කළ යෝජනාවට අනුව කටයුතු කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05-8)<u>ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක 06/49 - 08 දරණ යෝජනාව</u>**

නුගවෙල, මහරච්චිමුල්ල ලිපිනයේ නුගවෙල පුරාණ විහාරයේ පවත්වාගෙන යනු ලබන ශ්‍රී සෝනුත්තර පෙර පාසල අලව්ව ප්‍රාදේශීය සභාවට පවරා ගන්නා ලෙස එම විහාරස්ථානයේ විහාරාධිපති පූජ්‍ය මකුල්වැවේ විමලජෝති ස්වාමීන් වහන්සේ විසින් 2021.12.21 දිනැති ලිපිය මගින් ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති අතර එසේ පවරා ගැනීමක් සිදුකලහොත් පෙර පාසලට අයත් ගොඩනැගිල්ල හා භූමිය ප්‍රාදේශීය සභාවට නීත්‍යානුකූලව පවරා දීමට උන්වහන්සේ තවදුරටත් කැමැත්ත ප්‍රකාශ කරන බවට 2021.03.29 දිනැති ලිපිය මගින් ද ප්‍රකාශ කර ඇත. එකී ඉල්ලීම සලකා බලා සුදුසු තීරණයක් ගැනීම සඳහා ඉදිරිපත් කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම් නිහාල් ඒකනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, නුගවෙල පුරාණ විහාරයේ පවත්වාගෙන යනු ලබන ශ්‍රී සෝනුත්තර පෙර පාසල අලව්ව ප්‍රාදේශීය සභාවට පවරා ගන්නා ලෙස එම විහාරස්ථානයේ විහාරාධිපති පූජ්‍ය මකුල්වැවේ විමලජෝති ස්වාමීන් වහන්සේ විසින් ඉල්ලීමක් කර තිබෙනවා. ඒ අනුව එම පෙර පාසල ප්‍රාදේශීය සභාවට පවරාගැනීම සුදුසු බවට යෝජනා කරන අතර එම පෙරපාසල වැඩිදියුණු කිරීම සඳහා ඔබතුමියගේ අනුග්‍රහය ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා. නුගවෙල විහාරස්ථානය ඉතා කීර්තිමත් විහාරස්ථානයක්. එම ස්වාමීන් වහන්සේ ප්‍රදේශයේ ආගමික, සමාජීය සුභසාධන කටයුතු වලට විශාල කැපකිරීමක් කල ස්වාමීන් වහන්සේ නමක්. පසුගිය කාලයේ රු. ලක්ෂ 05 ක සූර්ය බලශක්ති කට්ටලයක් මෙම පන්සලට ලබා දීමට අපිට අවස්ථාව ලැබුනා. ස්වාමීන් වහන්සේගේ අධීක්ෂණ කටයුතු යටතේ සහ උන්වහන්සේගේ උපදේශකත්වය යටතේ සභාව සම්බන්ධ වී වඩාත් ගුණාත්මක පෙර පාසලක් ලෙස මෙම පෙර පාසල පවත්වාගෙන යාමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා. ඒ අනුව ගරු ස්වාමීන් වහන්සේ කල ඉල්ලීමට අපි සියළු දෙනාගේම සහයෝගය ලබා දෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, ප්‍රදේශයේ තිබෙන කීර්තිමත් මෙන්ම ඉතාම වැදගත් විහාරස්ථානයක් ලෙස නුගවෙල පුරාණ විහාරස්ථානය හැඳින්විය හැකියි. විහාරස්ථානයේ ස්වාමීන් වහන්සේගේ අනුශාසකත්වය යටතේ ශ්‍රී සෝණුත්තර පෙර පාසල ප්‍රාදේශීය සභාවට පවරාගෙන අවශ්‍ය කටයුතු කිරීම වඩාත් යෝග්‍ය වෙනවා. මෙය සභාවට විශාල ගෞරවයක්. සුදුසුකම් ලත් හොඳ පෙර පාසල් ගුරුවරියක් යොදාගෙන දෙමව්පියන්ට සහනදායී ලෙස රටේ අනාගතය වන පුංචි දූ දරුවන්ට සැබෑ පූර්ව ළමාවිය සංවර්ධනයක් ලබා දීමට අපිට හැකියාව ලැබෙනවා නම් එය ඉතාමත් වටිනවා. මෙම කටයුත්ත හැකි ඉක්මනින් ඉටු කර ගැනීමට ශක්තිය ලැබේවායි ප්‍රාර්ථනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඒ.පී ෂෙල්ටන් ප්‍රේමරත්න මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, මෙය ඉතාම වටිනා යෝජනාවක්. වෙනත් විහාරස්ථාන වලින් විවිධ දේ ලබා ගැනීමට උත්සාහ කරන විට නුගවෙල විහාරස්ථානයේ ස්වාමීන් වහන්සේගේ පරිත්‍යාගය ඉතාම වටිනවා. මේ තුලින් සභාවටත් විශාල ගෞරවයක් හිමිවෙනවා. එම නිසා මෙම යෝජනාවට කැමැත්ත ප්‍රකාශ කිරීම සුදුසු බවට යෝජනා කරනවා. එමෙන්ම තවත් ලියාපදිංචි නොවුනු පෙරපාසල් තිබෙනවා. පංගොල්ල පෙරපාසල ලියාපදිංචි කිරීමට උත්සාහ කලත් එය සිදුකල නොහැකි වුනා. ඒ සඳහා අවධානය යොමු කර එම පෙර පාසල අලව්ව ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචි කරගන්නා ලෙස ඉල්ලා සිටිනවා.

ඒ අනුව නුගවෙල, මහරච්චිමුල්ල ලිපිනයේ නුගවෙල පුරාණ විහාරයේ පවත්වාගෙන යනු ලබන ශ්‍රී සෝනුත්තර පෙර පාසල අලව්ව ප්‍රාදේශීය සභාවට පවරා ගැනීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05-9)<u>ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක 06/49 - 09 දරණ යෝජනාව</u>**
ඉන්ධන මිල ඉහළ යාම හා අමතර කොටස් වල මිල ඉහළ යාමත් සමඟ යන්ත්‍රෝපකරණ කුලියට දීම සඳහා බලපාන මිල ගණන් සංශෝධනය කර දෙන ලෙස කරන ලද ඉල්ලීමට අනුව වැඩ අධිකාරී මහතා සහ තාක්ෂණ නිලධාරී මහතා විසින් වාර්තාවක් ලබා දී ඇත. ඒ අනුව මෝටර් ග්‍රේඩරය සඳහා පැයකට අය කිරීම රු. 5114.00 ලෙස ද බැකෝ ලෝඩරය සඳහා අය කිරීම රු. 3395.00 ලෙස ද සංශෝධනය කර ඇත. මිල ගණන්වල වෙනස පහතින් සඳහන් කරන අතර අවශ්‍ය අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

| | පෙර පැවති මිල (රු.) | සංශෝධිත මිල (රු.) | මිල ගණන් වල |
|---|---|---|---|

| | | | වෙනස (රු.) |
|---|---|---|---|
| බැකෝ ලෝඩරය | 2865.00 | 3395.00 | 530.00 |
| මෝටර් ග්‍රේඩරය | 4410.00 | 5114.00 | 704.00 |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව ඉහත සංශෝධිත මිල ගණන් සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**(05-10)**<u>ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනියවිසින් කරනු ලබන අංක 06/49 - 10 දරණ යෝජනාව</u>

අලව්ව ප්‍රාදේශීය සභාවට අයත් අංක LE - 7413 දරණ බොලේරෝ රථයේ රේඩියේටර් ටැංකිය පුපුරා ඇති බැවින් එම ටැංකිය දැමීම සඳහා ලැබී ඇති මිල ගණන ඩොලරයේ අගය වෙනස් වීම මත දින 15 කට පමණක් ලබා දී ඇත. යාන්ත්‍රික ඉංජිනේරු මහතා ද මේ සඳහා නිර්දේශයක් ලබා දී ඇති අතර මෙය අත්‍යාවශ්‍ය කටයුත්තක් බැවින් එම ටැංකිය දමා අළුත්වැඩියාව සිදු කිරීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව අලව්ව ප්‍රාදේශීය සභාවට අයත් අංක LE - 7413 දරණ බොලේරෝ රථයේ රේඩියේටර් ටැංකිය දමා අළුත්වැඩියාව සිදු කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**(05-11)**<u>ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය විසින් කරනු ලබන අංක 06/49 - 11 දරණ යෝජනාව</u>

8 කණුව මිරිහෙලිය මාර්ගයේ ප්‍රාදේශීය සභා ඉඩමේ අනතුරුදායකව පිහිටි ගස් කපා ඉවත් කිරීම සඳහා මිල ගණන් කැඳවනු ලැබූ අතර ඒ සඳහා එක් මිල ගණනක් පමණක් ඉදිරිපත් වී තිබූ බැවින් එය 2022.03.23 දිනැති මුදල් කමිටුව වෙත යොමු කරන ලදි. එහිදී නැවත මිල ගණන් කැඳවීමට තීරණය විය. ඒ අනුව අප වෙත ලද මිල ගණන් මේ සමඟ ඉදිරිපත් කරන අතර මේ සම්බන්ධව තීරණයක් ගැනීම සුදුසු බවට යෝජනා කරමි.
.

| අනු අංකය | ගස් වර්ගය | වට ප්‍රමාණය | ගසේ උස | අවම තක්සේරු මුදල (රු.) | පී.ඩී.ඕ. වීරරත්න මයා, ගිරිඋල්ල පාර, අලව්ව |
|---|---|---|---|---|---|
| 01 | පොල් ගස | 2’- 7” | 80’- 0” | 2000.00 | 2000.00 |
| 02 | කොස් ගස (මැරී දිරාපත් වී ඇත) | 3’- 6” | 20’- 0” | 1000.00 | 1000.00 |
| 03 | කැටකාල ගස (මුල කුට්ටිය පමණයි) | 3’- 8” | 8’- 0” | 2500.00 | 2500.00 |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව ලැබී ඇති මිලගණන් අනුව අලව්ව පී.ඩී.සී.වීරරත්න යන අය වෙත ලබාදීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**(05-12)**<u>ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක **06/49 - 12** දරණ යෝජනාව</u>

2022/01/01 දින සිට රාජ්‍ය සේවකයන්ගේ රු. 5000.00 ක දීමනාවක් ලබා දීම හා උපාධිධාරී අභ්‍යාසලාභීන්ට ස්ථිර පත්වීම් ලබා දී ඉන් 14 දෙනෙකු මේ වන විට ප්‍රාදේශීය සභාව වෙත යොමු කර තිබීම නිසා ඔවුන්ට ප්‍රාදේශිය සභාව හරහා වැටුප් ගෙවීමට සිදුවේ. වැටුප් හා වේතන වැය ශීර්ෂය සඳහා 2022 වසරට ඇස්තමේන්තු කල ප්‍රතිපාදන වියදමට වඩා වැඩි වියදමක් දැරීමට සිදුවන අතර මෙම මුදල් පළාත් පාලන දෙපාර්තමේන්තුව හරහා වැටුප් ප්‍රතිපූර්ණ ආදායම ලෙස ලැබෙන බැවින් පහත සඳහන් පරිපූරකය සඳහා මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

| වැයශීර්ෂය | විස්තරය | 2022 අයවැයමගින්වෙන්කල අයප්‍රතිපාදනය | පලාත්සභාවහාමධ්‍යමරජයහරහාලදප්‍රතිපාදන | ඒඅනුවපරිපූරකය |
|---|---|---|---|---|
| 1-1-101-1 | වැටුප්හාවේතන | 21,000,000.00 | 5,290,320.00 | |
| 1-1-101-9 | | 5,500,000.00 | 5,570,400.00 | |
| 1-3-101-9 | | 450,000.00 | 120,000.00 | |
| 2-3-201-9 | | 500,000.00 | 60,000.00 | |
| 2-5-201-9 | | 2,500,000.00 | 1,260,000.00 | |
| 3-1-301-9 | | 550,000.00 | 240,000.00 | |
| 3-3-301-9 | | 2,600,000.00 | 1,200,000.00 | |
| 6-2-601-9 | | 618,000.00 | 480,000.00 | |
| 6-7-601-9 | | 500,000.00 | 180,000.00 | |
| 6-3-601-9 | | 225,000.00 | 60,000.00 | |
| 5-2-501-9 | | 125,000.00 | 60,000.00 | |
| | | **34,568,000.00** | **14,520,720.00** | **14,520,720.00** |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුවඉහත සඳහන් පරිපූරකය සඳහා මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**(05-13)**<u>ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක **06/49 - 13** දරණ යෝජනාව</u>

අලව්ව ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලය සඳහා අවශ්‍ය ලිපිද්‍රව්‍යමිලදී ගැනීම සඳහා මිල ගණන් ඉදිරිපත් කර ඇති අතර එම ආයතන අතුරින් ගුණාත්මක බවින් ඉහළ සහ අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති ආයතන මගින් අවශ්‍ය ලිපිද්‍රව්‍ය මිලදී ගැනීම සුදුසු බවට යෝජනා කරමි.

| අනු අංකය | භාණ්ඩ, ද්‍රව්‍යහාසේවාවිස්තරය | ඉදිරිපත් කර ඇති මිල ගණන් | | | |
|---|---|---|---|---|---|
| | | **පේපර් කෝනර් ¾ මලියදේව වීදිය කුරුණෑගල** | **යූ.එස්.ඩී.ට්‍රේඩිං නො.71,බෝධිරාජ මාවත කුරුණෑගල** | **සමුද්‍රා කොන්සොලිඩේටඩ් ප්‍රයිවට් ලිමිටඩ්, මිහිඳු මාවත** | **සී/ස රාජ්‍ය වාණිජ විවිධ** |

| | | | | කුරුණෑගල | නීතිගත සංස්ථාව පුත්තලම් පාර කුරුණෑගල |
|---|---|---|---|---|---|
| 01 | පර්මනන්ට් මාර්කර් (නිල්/කළු) | රු.81.00/රු.125.00 | රු.90.00/රු130.00 | රු.90.00/රු.190.00 | - |
| 02 | වයිට්බෝඩ් මාර්කර් (නිල්/කළු) | රු.81.00/රු180.00 | රු.90.00/රු.195.00 | රු.95.00 | රු. 82.00 |
| 03 | කැල්කියුලේටර් MJ 120 D | රු.2,150.00 | රු.2325.00 | රු.2830.00 | රු. 1935.00 |
| 04 | රේන්බෝ කඩදාසි පැකට් (කොල 250) | රු.1700.00 | රු.1800.00 | රු.1700.00 | රු.1100.51 |
| 05 | 9X 4 ලියුම් කවර | 100 ක් රු.425.00 | 100 ක් රු.500.00 | 100 ක් රු.256.00 | 100 ක් රු.275.00 |
| 06 | 14 X 10 ලියුම් කවර | 100 ක් රු.1400.00 | 100 ක් රු.1525.00 | 100 ක් රු.1159.00 | 100 ක් රු.835.00 |
| 07 | පන්චර් | රු.400.00 | රු.425.00 | රු.360.00 | රු.485.00 |
| 08 | බොක්ස් ෆයිල් 3" | රු.520.00 | රු.595.00 | රු.437.00 | රු.309.00 |
| 09 | සර්ජිකල් මාස්ක් (3 PLY) | රු.340.00 | රු.390.00 | රු.450.00 | රු.500.00 |
| 10 | A 4 පොටෝකොපි කඩදාසි (GSM 80) Avalone | රු.2500.00 | රු.2850.00 | නැත | රු.2975.00 |
| 11 | CR – 10(පිටු 400) | රු.337.50 | රු.390.00 | රු.405.00 | රු.432.00 |
| 12 | CR – 5(පිටු 200) | රු.180.00 | රු.195.00 | රු.216.00 | රු.240.00 |
| 13 | CR – 4 (පිටු 160) | රු.180.00 | රු.197.00 | රු.184.50 | රු.180.00 |
| 14 | CR – 3 (පිටු 120) | රු.127.50 | රු.135.00 | රු.153.00 | රු.149.00 |
| 15 | CR – 2 (පිටු 80) | රු.90.00 | රු.95.00 | රු.117.00 | රු.114.00 |
| 16 | Exe. Book පිටු200 | රු.93.75 | රු.95.50 | රු.103.50 | රු.107.00 |
| 17 | Exe. Book පිටු160 | රු.71.25 | රු.75.00 | රු.90.00 | රු.100.00 |
| 18 | Exe. Book පිටු120 | රු.60.00 | රු.67.00 | රු.67.50 | රු.67.00 |
| 19 | Exe. Book පිටු80 | රු.41.25 | රු.45.00 | රු.49.50 | රු.48.00 |
| 20 | Exe. Book පිටු40 | රු.26.25 | රු.30.00 | රු.49.50 | රු.35.00 |
| 21 | ටිපෙක්ස් බෝතල් | රු.76.50 | රු.80.00 | රු.36.00 | රු.60.50 |
| 22 | LQ 2190-2180 රිබන් | රු.5000.00 | රු.5350.00 | රු.90.25 | - |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි සී.ජී ශ්‍රියානි ජයලත් මැතිනිය**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව අලව්ව ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලය සඳහා අවශ්‍ය ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා ගුණාත්මක බවින් ඉහළ සහ අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති ආයතන මගින් අවශ්‍ය ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05-14)**<u>**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක 06/49 - 14 දරණ යෝජනාව**</u>

අලව්ව ප්‍රාදේශීය සභාවේ අලව්ව මහජන පුස්තකාලය සඳහා අවශ්‍ය විදුලි උපකරණ සහ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා අවශ්‍ය ප්ලාස්ටික් පුටුමිලදී ගැනීම සඳහා මිල ගණන් ඉදිරිපත් කර ඇති අතර වැකියුම් ක්ලීනරය සහ වතුර පිල්ටරය සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති නො. 07, දඹුල්ල පාර, කුරුණෑගල ලිපිනයේ ක්‍රියාත්මක ඌෂා ෂෝ රූම් ආයතනය මගින් ද ඇඳි රහිත ප්ලාස්ටික් පුටු සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති කොළඹ පාර, වැහැර, කුරුණෑගල ලිපිනයේ ක්‍රියාත්මක කූල්වේ ආයතනය මගින් ද මිලදී ගැනීම සුදුසු බවට යෝජනා කරමි.

| අනු අංකය | භාණ්ඩ, ද්‍රව්‍ය හා සේවා විස්තරය | ඉදිරිපත් කර ඇති මිල ගණන් | | | |
|---|---|---|---|---|---|
| | | **ඌෂා ෂෝ රූම් නො.07, දඹුල්ල පාර කුරුණෑගල** | **කූල්වේ කොළඹ පාර, වැහැර කුරුණෑගල** | **ඇල්ෆා ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්)ලිමිටඩ් අයිස්ලන්ඩ් බිල්ඩිං 49/16, ගාලුපාර කොළඹ 3** | **එල්.ජී.අබාන්ස් ලිමිටඩ් කොළඹ පාර කුරුණෑගල** |
| 01 | **වැකියුම් ක්ලීනර්** | **රු.25,500.00** | **රු.25,900.00** | **ඉදිරිපත් කර නැත** | **රු.27,900.00** |
| 02 | **බිත්ති ඔරලෝසු** | **ඉදිරිපත් කර නැත** | **ඉදිරිපත් කර නැත** | **ඉදිරිපත් කර නැත** | **ඉදිරිපත් කර නැත** |
| 03 | **වතුර පිල්ටර්** | **රු.21,900.00** | **රු.22,390.00** | **ඉදිරිපත් කර නැත** | **රු.27,900.00** |
| 04 | **ප්ලාස්ටික් පුටු (ඇඳි රහිත)** | **රු.2,450.00** | **රු.2,390.00** | **රු.2,790.00** | **ඉදිරිපත් කර නැත** |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව අලව්ව ප්‍රාදේශීය සභාවේ අලව්ව මහජන පුස්තකාලය සඳහා අවශ්‍ය වැකියුම් ක්ලීනරය සහ වතුර පිල්ටරය සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති නො. 07, දඹුල්ල පාර, කුරුණෑගල ලිපිනයේ ක්‍රියාත්මක ඌෂා ෂෝ රූම් ආයතනය මගින් ද ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා අවශ්‍ය ඇඳි රහිත ප්ලාස්ටික් පුටු සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති කොළඹ පාර, වැහැර, කුරුණෑගල ලිපිනයේ ක්‍රියාත්මක කූල්වේ ආයතනය මගින් ද මිලදී ගැනීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05-15)<u>ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක 06/49 - 15 දරණ යෝජනාව</u>**

අලව්ව ප්‍රාදේශීය සභාවේ අංක RD-1601 දරන රෝද හතරේ ට්‍රැක්ටරය සඳහා ඇම්පියර් 92 බැටරියක් මිලදී ගැනීම සඳහා මිල ගණන් ඉදිරිපත් කර ඇති අතර එකී මිල ගණන් තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත යොමු කර එකී නිර්දේශ මත සුදුසු ආයතනයක් මගින් මිලදී ගැනීම සුදුසු බවට යෝජනා කරමි.

| අනු අංකය | භාණ්ඩ, ද්‍රව්‍ය හා සේවා විස්තරය | ඉදිරිපත් කර ඇති මිල ගණන් | | | |
|---|---|---|---|---|---|
| | | බුද්ධික ටයර් සෙන්ටර් නො.258 මීගමු පාර, කුරුණෑගල | ජයමිණි ටයර් සර්විසස් මීගමු පාර මැටියගනේ | බටේපොල ටයර් හවුස් කුරුණෑගල පාර උයන්වත්ත කුරුණෑගල | තිලාන් ටයර් සෙන්ටර් යූ.බී.විජේකෝන් මාවත නාරම්මල |
| | | **රු.42,000.00** | **රු.36,950.** | **රු.36,000.00** | **රු.36,750.00** |

| | | | | | |
|---|---|---|---|---|---|
| 01 | ඇම්පියර් 92 බැටරි 1 ක් | **Amaron (4 yearwarrenty)**<br><br>රු.41,000.00<br>**Emtrac (4 year warrenty)** | 00<br>**Exide (2 yearwarrenty)** | **Exide (2 yearwarrenty )** | **Exide (2 yearwarrenty)** |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව අලව්ව ප්‍රාදේශීය සභාවේ අංක RD-1601 දරන රෝද හතරේ ට්‍රැක්ටරය සඳහා ඇම්පියර් 92 බැටරියක් මිලදී ගැනීම සඳහා ඉදිරිපත් කර ඇති මිල ගණන් තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත යොමු කර එකී නිර්දේශ මත සුදුසු ආයතනයක් මගින් මිලදී ගැනීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**(05-16)**<u>ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක **06/49 - 16** දරණ යෝජනාව</u>

අලව්ව ප්‍රාදේශීය සභාවේ බෝයවලාන සතිපොල භූමියට අවශ්‍ය ලීටර් 1000 ප්ලාස්ටික් ජල ටැංකියක්මිලදී ගැනීම සඳහාමිල ගණන් ඉදිරිපත් කර ඇති අතර අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති නාරම්මල පාර, අලව්ව ලිපිනයේ ක්‍රියාත්මක ධම්මික හාඩ්වෙයාර් ආයතනය මගින් මගින් මිලදී ගැනීම සුදුසු බවට යෝජනා කරමි.

| අනු අංකය | භාණ්ඩ, ද්‍රව්‍ය හා සේවා විස්තරය | ඉදිරිපත් කර ඇති මිල ගණන් | | | |
|---|---|---|---|---|---|
| | | ඇපල් හාඩ්වෙයර්, බස් නැවතුම්පල අලව්ව | **රනතුංග හාඩ්වෙයර් නාරම්මල පාර අලව්ව** | **ධම්මික හාඩ්වෙයර්, නාරම්මල පාර අලව්ව.** | අයි.ආර්.එස්.හාඩ්වෙයර් වාරියගොඩ අලව්ව |
| 01 | **ලීටර් 1000 ප්‍රමාණයේ ප්ලාස්ටික් ජල ටැංකියක්** | **රු.15,900.00** | **රු.15750.00** | **රු.15,700.00** | **රු.16800.0** |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී නලින් ඩයස් රාජපක්ෂ මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව අලව්ව ප්‍රාදේශීය සභාවේ බෝයවලාන සතිපොල භූමියට අවශ්‍ය ලීටර් 1000 ප්ලාස්ටික් ජල ටැංකියක් මිලදී ගැනීම සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති නාරම්මල පාර, අලව්ව ලිපිනයේ ක්‍රියාත්මක ධම්මික හාඩ්වෙයාර් ආයතනය මගින් මගින් මිලදී ගැනීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05-17)**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.පී නන්දසිරි මැතිතුමා විසින් කරනු ලබන අංක **06/49 - 17** දරණ යෝජනාව</u>

මා විසින් මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ යෝජනා කරනලද අග්බෝව ක්‍රීඩා පිටියට වැසිකිළියක් ඉදි කිරීමේ රු. 100,000.00 ක යෝජනාවත්, තුඹුලුකන්ද බුදු මැදුර අසල ගල් බැම්ම ඉදි කිරීමේ රු. 50,000.00 ක යෝජනාවත් සංශෝධනයට ලක් කර අලව්ව මහජන පුස්තකාලයේ මිදුලේ

කැටගල් ඇල්ලීම සඳහා රු. 100,000.00 ක මුදලකුත්,බෝයවලාන සහ මහරච්චිමුල්ල මහජන පුස්තකාල සඳහා පොත් ලබා ගැනීමට රු. 25,000.00 බැගිනුත් වෙන් කිරීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජ් මොහාන් සුජිව වික්‍රමනායක මැතිතුමා**
